# කාන්තාව, කෝටාව සහ පුවත්පත්

## 2018 පළාත් පාලන මැතිවරණය පිළිබඳ මාධ්‍ය ආවරණය

පළාත් පාලන ආයතනවල කාන්තාවන් වෙනුවෙන් සම්මත කරගත් ඓතිහාසික 25% කෝටාව පිළිබඳව 2017 සැප්තැම්බර් සිට 2018 දෙසැම්බර් දක්වා පළ වූ පුවත්පත් වාර්තාකරණය පිළිබඳ පර්යේෂණයක්


WMC කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය

Norwegian Embassy Colombo රාජකීය නෝර්වීජියානු තානාපති කාර්යාලය

# කාන්තාව කෝටාව සහ පුවත්පත්

## 2018 පළාත් පාලන මැතිවරණය පිළිබඳ මාධ්‍ය ආවරණය

පළාත් පාලන ආයතනවල කාන්තාවන් වෙනුවෙන් සම්මත කරගත් ඓතිහාසික 25% කෝටාව පිළිබඳව 2017 සැප්තැම්බර් සිට 2018 දෙසැම්බර් දක්වා පළ වූ පුවත්පත් වාර්තාකරණය පිළිබඳ පර්යේෂණයක්


පළමු මුද්‍රණය - 2021
කාන්තාව හා මාධ්‍ය සාමූහිකය
රචනය : ඉරෝමි පෙරේරා
පර්යේෂකයන්: ක්ෂමා රණාවන, තුෂාරි මඩහපොල සහ එච් ඉන්දුමදී
සංස්කරණය : කුමුදිනි සැමුවෙල් සහ සැන්ඩියා බ්‍රවුන්
පිටු සැලසුම : දේව ගව්රි
මුද්‍රණය: Neo Graphics ප්‍රින්ටර්ස්
සහාය: රාජකීය නෝර්වීජියානු තානාපති කාර්යාලය

Norwegian Embassy
*Colombo*

ප්‍රකාශයට පත්කරනු ලැබුයේ:

WMC



කාන්තා හා මාධ්‍ය සාමූහිකය
56/1, සරසවි පටුමග, කාසල් වීදිය, කොළඹ 08, ශ්‍රී ලංකාව.
විද්‍යුත් තැපෑල: wmcsrilanka@womenandmedia.org
වෙබ්: womenandmedia.org
ෆේස්බුක්: https://www.facebook.com/womenandmediacollective
ට්විටර්: https://twitter.com/womenandmedia



ISBN 978-624-5868-01-8

# අන්තර්ගතය


| | |
|---|---|
| පෙරවදන | 04 |
| විධායක සාරාංශය | 05 |
| හැඳින්වීම | 08 |
| ක්‍රමවේදය | 09 |
| ප්‍රධාන සොයාගැනීම් | 10 |
| පුවත්පත් වාර්තා කළේ කෙසේද? | 13 |
| වාර්තාකරණයේ ප්‍රධාන ගැටළු සහ දුර්වලතා | 24 |
| නිර්දේශ සහ යහපත් භාවිතාවන් | 26 |


## වගු ලැයිස්තුව


| | |
|---|---|
| වගුව 1: රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍යවලින් තෝරාගත් පුවත්පත් | 09 |
| වගුව 2: මැතිවරණයට පෙර සතිපතා පුවත්පත්වල පළ වූ ලිපි ගණන | 25 |


## ප්‍රස්තාර ලැයිස්තුව


| | |
|---|---|
| 1 වන ප්‍රස්තාරය: ලිපි ගණන සැප්තැම්බර් 2017 - දෙසැම්බර් 2018 | 10 |
| 2 වන ප්‍රස්තාරය: පුවත්පත් වශයෙන් පළ වූ ලිපි ගණන | 11 |
| 3 වන  වන ප්‍රස්තාරය: ලිපි වර්ගය | 11 |
| 4 වන  වන ප්‍රස්තාරය: මුල් පිටුවේ ලිපි | 12 |

# පෙරවදන

2018 පෙබරවාරි මස පැවති පළාත් පාලන මැතිවරණය සැලකිය යුතු මැතිවරණයකි. 2017 දී සංශෝධිත, 2012 දී පළාත් පාලන මට්ටමින් හඳුන්වා දුන් නව දෙමුහුන් මැතිවරණ ක්‍රමය යටතේ පැවැත්වූ පළමු මැතිවරණය මෙය වේ. මෙය තවත් හේතුවක් නිසා අපට වැදගත් වේ. පළාත් පාලන ආයතනවල කාන්තාවන් සඳහා 25% ක අනිවාර්ය කෝටාවක් ක්‍රියාත්මක වූ පළමු මැතිවරණය මෙයයි.

මෙහි ප්‍රතිඵලය වූයේ පළාත් පාලන ආයතනවල මුළු නියෝජිත සංඛ්‍යාව 4486 සිට සාමාජිකයන් 8356 දක්වා වැඩි වීමයි. සංශෝධනයේ 27 එෆ් වගන්තිය ප්‍රකාරව, සෑම පළාත් පාලන ආයතනයකම සිටින මුළු සාමාජික සංඛ්‍යාවෙන් 25% ක් කාන්තා සාමාජිකාවන් විය යුතුය පසුගිය වසරවල පැවති 1.8% කාන්තා නියෝජනයට සාපේක්ෂව මෙය සැලකිය යුතු ජයග්‍රහණයකි.

මෙම පසුබිම යටතේ, මෙම පර්යේෂණය ඓතිහාසික කාන්තා කෝටාව ක්‍රියාත්මක කිරීම පිළිබඳ පුවත්පත් වාර්තාකරණය දෙස අවධානය යොමු කරයි. පර්යේෂණයේදී අදියර තුනකින් පුවත්පත් විමර්ශනයට ලක් කරනු ලැබීය. පළමුවැන්න, 2017 අංක 16 දරණ පළාත් පාලන ආයතන මැතිවරණ (සංශෝධන) පනත පාර්ලිමේන්තුවේදී සම්මත වූ කාලයේ සිට 2018 පළාත් පාලන මැතිවරණය ප්‍රකාශයට පත් කිරීම අයත් වන 2017 සැප්තැම්බර් සිට නොවැම්බර් දක්වා කාල පරිච්ඡේදයයි. දෙවැනි අදියර මගින් 2017 දෙසැම්බර් සිට 2018 පෙබරවාරි දක්වා මැතිවරණ දිනය ආවරණය කාලයයි. මෙම කාලවකවානුවේ දී මැතිවරණ ප්‍රචාරක කටයුතු, මැතිවරණ කාලය තුළ මතු වූ ගැටළු සහ  මැතිවරණ දිනය ආවරණය කෙරේ. තෙවන අදියරේ දී, 2018 පෙබරවාරි සිට 2018 දෙසැම්බර් දක්වා මාධ්‍යවල කෝටාව වාර්තා කළ ආකාරය තේරුම් ගැනීමට පාදක කරගත් පශ්චාත් මැතිවරණ කාලයයි.

මෙම පර්යේෂණය සම්පාදනය කිරීම සඳහා කාන්තාව සහ මාධ්‍ය සාමූහිකයට බොහෝ පුද්ගලයින්ගේ සහාය ලැබුණි.  පර්යේෂණ සොයා ගැනීම් විශ්ලේෂණය කර පර්යේෂණ වාර්තාව රචනා කිරීම ගැන ඉරෝම් පෙරේරාට අපි අවංකවම ස්තුතිවන්ත වෙමු. ලිපි සොයා ගැනීමට සහ විශ්ලේෂණය කිරීමට  දැරූ උත්සාහය වෙනුවෙන් ක්ෂමා රණාවන, තුෂාරි මඩහපොල සහ එච් ඉන්දුමදීටත්, පර්යේෂණය සංකල්පනය කිරීම හා සංස්කරණය කිරීම පිළිබඳව කුමුදිනි සැමුවෙල්ටත් බොහෝ ස්තුතිවන්ත විය යුතුය. මෙම පර්යේෂණය සිංහල හා දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම ගැන ඉනෝකා ප්‍රියදර්ශනී සහ රාම්චන්ද්‍රන් ප්‍රියදර්ශනීට ද ස්තූති කරන්නෙමු. මෙම පර්යේෂණයේ භාෂා සංස්කරණය සහ සෝදුපත් කියවීම සම්බන්ධයෙන් අපගේ ස්තූතිය සීතා රංජනී සහ කුහානිති වෙත පුද කරන්නෙමු. මෙම ප්‍රකාශනයේ පිටු සැලසුම්කළ  එම්. එස්. ටී. ගව්රි ට අපගේ ස්තූතිය ප්‍රකාශ කරන්නෙමු.

රාජකීය නෝර්වීජියානු තානාපති කාර්යාලයේ සහාය ඇතිව මෙම පර්යේෂණය ප්‍රකාශයට පත් කරන ලදී. මොනිකා ස්වෙන්ස්ක්රෑඩ් මහත්මියගේ සහ සුන්දරි ජයසුන්දර මහත්මියගේ සහයෝගය වෙනුවෙන් අපි විශේෂයෙන් ස්තූතිවන්ත වෙමු. පසුගිය වසර 20 තුළ විශේෂයෙන් ප්‍රාදේශීය මට්ටමින් කාන්තාවන්ගේ නියෝජනය වැඩි කිරීම සඳහා කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය බොහෝ උපාය මාර්ග භාවිතා කර කටයුතු කළේය. වර්තමානයේ කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය කාන්තාවන්ගේ දේශපාලන නියෝජනය ශක්තිමත් කරමින් ශ්‍රී ලංකාව තුළ ආචාරධාර්මික දේශපාලන සංස්කෘතියක් ගොඩනැගීමට කටයුතු කරමින් සිටී.

ඒ අනුව, පළාත් පාලන ආයතනවල කාන්තාවන් සඳහා අනිවාර්ය 25% කෝටාව ආරක්ෂා කිරීමේ අරමුණින් මෙම පර්යේෂණය සිදු කරන ලදී.

**සැන්ඩියා බ්‍රවුන්**
**වැඩසටහන් නිලධාරී**
**කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය,**
**2021 ජනවාරි**

# විධායක සාරාංශය

- පළාත් පාලන ආයතනවල කාන්තාවන් සඳහා නීත්‍යානුකූලව වෙන් කරන ලද 25% ක කෝටාව ක්‍රියාත්මක කිරීමට ප්‍රතිචාර දැක්වීම, දේශපාලනය තුළ කාන්තා නියෝජනය පිළිබඳ දැනුම ගොඩනැගීම සහ දැනුම බෙදාගැනීම සහ සුවිශේෂී ක්‍රියාමාර්ග වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාව අරමුණු කරගෙන පුවත්පත් වාර්තාකරණය පිළිබඳව වන මෙම පර්යේෂණය කරන ලදී.

- මෙම අධ්‍යයනය සඳහා 2017 සැප්තැම්බර් - 2018 දෙසැම්බර් කාලය තුළ පළ කරන ලද පුවත්පත් වාර්තාකරණය ආවරණය කරන ලදී. මෙම පර්යේෂණ අධ්‍යයනය සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන සෑම භාෂා කාණ්ඩයකින් ම දිනපතා පුවත්පත් දෙකක් සහ සති අන්ත පුවත්පත් දෙක බැගින් තෝරා ගන්නා ලදී. ප්‍රධාන ධාරාවේ මාධ්‍ය වාර්තා ග්‍රහණය කර ගැනීමේ අරමුණින් රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍ය ඇතුලත් වන ආකාරයෙන් පුවත්පත් හඳුනා ගන්නා ලදී. තෝරාගත් පුවත්පත් වූයේ සන්ඩේ ටයිම්ස්, සන්ඩේ ඔබ්සර්වර්, ඩේලි මිරර්, ඩේලි නිවුස් (ඉංග්‍රීසි භාෂාව); දිනමිණ, සිළුමිණ, ඉරිදා ලංකාදීප සහ ලංකාදීප (සිංහල භාෂාව): ඉරිදා වීරකේසරි, වීරකේසරි, ඉරිදා තිනකරන් සහ තිනකරන් (දමිළ භාෂාව) ය.

- 2017 සැප්තැම්බර් - 2018 දෙසැම්බර් අතර වූ පර්යේෂණ කාලය තුළ, භාෂා තුනෙන් ම නිරීක්ෂණය කරන ලද පුවත්පත් දොළහ තුළ කාන්තා කෝටාව පිළිබඳව හෝ ඊට අදාළ ලිපි 415 ක් ප්‍රකාශයට පත් කර තිබුණි. ඉන් 117ක් ඉංග්‍රීසි ද, 148 සිංහල හා 150ක් දමිළ යන භාෂාවන්ගෙන් වූ පුවත්පත්වල පළකර තිබුණි. කාන්තාවන් සඳහා වූ කෝටාව ගැන හෝ ඒ ගැන සඳහන් කරන ලිපි සංඛ්‍යාව 2018 පෙබරවාරි මැතිවරණයට පෙර මාසවල (2017 දෙසැම්බර් සහ 2018 ජනවාරි) ඉහළ මට්ටමක පැවති අතර 2018 පෙබරවාරි මාසයේදී උච්ච මට්ටමකට පැමිණි අතර ඊළඟ මාසවලදී එය අඩු විය.

- මෙම කාල පරිච්ඡේදය තුළ ප්‍රකාශයට පත් කරන ලද ලිපි දෙස බලන විට, ඒවායින් අඩකටත් වඩා එනම්, 242ක් ප්‍රවෘත්ති වාර්තා විය. විශේෂාංග ලිපි 79ක් ද, සම්මුඛ සාකච්ඡා 43ක් ද, විවිධ මත ප්‍රකාශ කරන ලිපි 28ක් ද කතුවැකි 23ක් ද විය. පර්යේෂණ කාලපරිච්ඡේදය තුළ ලියන ලද ලිපි/වාර්තා 415න්, වාර්තා 30ක් මුල් පිටුවේ පළකර තිබූ අතර ඉන් 15ක් ඉංග්‍රීසි පුවත්පත්වල පළකර තිබුණි. ඉංග්‍රීසි පුවත්පත්වල පළවූ වාර්තා 15න් 10ක් 2018 පෙබරවාරි මාසයේදී පළකර තිබුණි. සිංහල පුවත්පත්වල ද පළ වූ ලිපි 9න් 6ක් ම 2018 පෙබරවාරි මාසයේ දී පළකර තිබුණි. දමිළ පුවත්පත්වල පළකර තිබූ වාර්තා 6න් 3ක් 2018 ජනවාරි මාසයේ පළකර තිබුණි. 2018 අප්‍රේල් මාසයේ පළමු පිටුවෙහි වාර්තාවක් පළකර තිබූ ඉරිදා වීරකේසරි හැරුණු විට, මෙම කාල සීමාව තුළ සතිපතා පුවත්පතක් කිසිවක් මුල් පිටුවේ වාර්තාවක් පළකර නොතිබීම සැලකිය යුතු කරුණක් වේ.

- 2017 සැප්තැම්බර් සිට 2018 දෙසැම්බර් දක්වා පුවත්පත් වාර්තාකරණය දෙස බලන විට කාන්තාවන් සඳහා වූ කෝටාව ක්‍රියාත්මක කිරීම ආවරණය කිරීම ප්‍රධාන අදියර තුනකට හඳුනා ගත හැකි ය. පළමු වැන්න නම් 2017 සැප්තැම්බර් - නොවැම්බර් කාල පරිච්ඡේදයයි. මෙම කාලයේ දී 2017 අංක 16 දරණ පළාත් පාලන ආයතන මැතිවරණ (සංශෝධන) පනත සහ 25% කෝටාව ක්‍රියාත්මක කරන ලද ප්‍රථම මැතිවරණය වන, 2018 පෙබරවාරි පළත් පාලන මැතිවරණය ප්‍රකාශයට පත් කිරීම ආවරණය කරයි. දෙවැන්න නම්, මැතිවරණයට පෙරාතුව මැතිවරණ ප්‍රචාරක කටයුතු හා ඒ හා සම්බන්ධ ගැටළු සහ පෙබරවාරි මාසයේ දී පැවැත්වීමට නියමිත මැතිවරණය ආවරණය වන 2017 දෙසැම්බර් - 2018 පෙබරවාරි කාලයයි. තෙවැන්න පශ්චාත් මැතිවරණය කාලයයි. මෙහිදී කෝටාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ගැටළු සහ සියලු ම සභාවන්ට 25% ක නියෝජනයක් ඇති බව සහතික කිරීමේ දී ඇති වන අභියෝග පිළිබඳව වැඩි ආවරණයක් කර ඇත.

- 2017 අගෝස්තු මස 16 වන දින අංක 16 පළාත් පාලන මැතිවරණ (සංශෝධන) පනත පාර්ලිමේන්තුවේ සම්මත වීමෙන් පසුව, මෙම පනත මගින් සිදු කරනු ලබන වෙනස්කම් මොනවාද යන්න පිළිබඳව පුවත්පත් විස්තරාත්මකව වාර්තා කර තිබුණි. ඒ

අතර පුවත්පත් සම්මුඛ සාකච්ඡාවන්ට භාජනය වූ බොහෝමයක් දෙනෙක් පනත මගින් ඇති කරනු ලබන ප්‍රගතිශීලී වෙනස්කම් පිළිබඳව ප්‍රශංසාත්මක අදහස් ප්‍රකාශ කර තිබුණි. මෙම ලිපිවල වැඩිවශයෙන් ම උපුටා දැක්වීම්වලට හෝ සම්මුඛ සාකච්ඡාවලට භාජනය වී තිබුණේ පළාත් පාලන හා පළාත් සභා අමාත්‍ය ෆයිසර් මුස්තාපා මහතා ය. ඔහු සංශෝධනවල වඩාත්ම වැදගත් අංග ආරක්ෂා කරන ලෙස සියලු දේශපාලන පක්ෂවලින් ඉල්ලා සිටි බව සඳහන් කර ඇත. කාන්තා කෝටාවේ වැදගත්කම පිළිබඳව අදහස් සහිත අනෙකුත් රජයේ සාමාජිකයන් සමග කරන ලද සම්මුඛ සාකච්ඡා රැගත් විශේෂාංග ලිපි කිහිපයක් ද පළකර තිබුණි. නමුත්, පනත සම්මත කිරීම සම්බන්ධව කාන්තාවන් සමග සම්මුඛ සාකච්ඡා පවත්වා නොතිබුණි. එමෙන්ම, කෝටාවේ වැදගත්කම පිළිබඳව භාෂා තුනෙන් ම පළකර තිබූ උපුටනයන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් කරන ලද ප්‍රකාශ විය. භාෂා තුනෙන් ම පළවූ බොහොමයක් ලිපි, ලොව ප්‍රථම අග්‍රාමාත්‍යවරිය සහ ප්‍රථම ජනාධිපතිවරිය ශ්‍රී ලංකාවෙන් බිහිවී තිබියදීත්, ප්‍රාදේශීය, පළාත් සහ පාර්ලිමේන්තු යන සෑම මට්ටමකදී ම කාන්තා නියෝජනය දකුණු ආසියානු කලාපයට සාපේක්ෂව ඉතාමත් අසතුටුදායක තත්ත්වයක පවතින බව පෙන්වා දී තිබේ.

■ පළාත් පාලන මැතිවරණයට පෙර කරන ලද මැතිවරණ ප්‍රචාරණ කාලය තුළ දී, පුවත්පත් ආවරණය, විශේෂයෙන් ම ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළවූ පුවත්පත් අවධානය යොමුකර තිබුණේ මැතිවරණ ප්‍රචණ්ඩත්වය පිළිබඳවය. මෙයට මැතිවරණ නිරීක්ෂණ ආයතන වන නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරිත්වය මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය සහ නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ජනතා ව්‍යාපාරය යන සංවිධාන විසින් කරන ලද කටයුතු, ප්‍රකාශ හා යාවත්කාලීන කිරීම් අඩංගු වාර්තා මෙන්ම කාන්තා ක්‍රියාකාරී ජාලය වැනි සිවිල් සමාජ කණ්ඩායම් විසින් කරන ලද විස්තරාත්මක විශ්ලේෂණයන් ද අන්තර්ගත විය. අපේක්ෂිකාවන් ලෙස වෙනස් කරන්න එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ විමර්ශන සහ එවැනි ප්‍රචණ්ඩත්වයට එරෙහිව ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ අනතුරු ඇඟවීම් සහිත මැතිවරණ කොමිසම විසින් නිකුත් කරන ලද ප්‍රකාශ කිහිපයක් ද විය. මැතිවරණ කොමිසම විසින් නිකුත් කරන ලද ප්‍රකාශවල කාන්තාවන්ට එරෙහිව ප්‍රචණ්ඩත්වය පැවති ප්‍රදේශවල මැතිවරණ කල් දමන බවට කරන අනතුරු ඇඟවීම් ද ඇතුළත් විය.

■ මැතිවරණ ප්‍රචාරණ සමයේ දී ප්‍රචණ්ඩත්වයට අමතරව අපේක්ෂිකාවන් මුහුණදුන් අභියෝග ද භාෂා තුනෙන් ම කර තිබූ මාධ්‍ය ආවරණය මගින් ඉස්මතු කර දැක්විය. කාන්තාවන්ට තරඟ කිරීම දුෂ්කර කරන දඬුවමෙන් නිදහස්වීමේ සංස්කෘතිය, නාමයෝජනා ලබා ගැනීමේ සිට දේශපාලන පක්ෂවල සහයෝගය නොමැතිකම, අදාළ ලැයිස්තුවලට ඔවුන්ගේ නම් ඇතුළත් කර ගැනීමේ දුෂ්කරතාවය හා මුස්ලිම් ජාතික අපේක්ෂිකාවන් මුහුණ දෙන සුවිශේෂී ගැටළු ආදී ගැටළු පරාසයක් මෙම අභියෝගවලට අයත් වේ. මැතිවරණ නිරීක්ෂණ ආයතන මෙන්ම අපේක්ෂිකාවන් මුහුණ දුන් අභියෝග ඉස්මතු කර පෙන්වීම පිණිස නිශ්චිත ක්ෂේත්‍රවල අභියෝග සහ ගැටළු පිළිබඳ උදාහරණ සැපයූ සිවිල් සමාජ කණ්ඩායම් විසින් කරන ලද ප්‍රකාශ සහ මාධ්‍ය යාවත්කාලීන කිරීම් මගින් මෙම මාධ්‍ය වාර්තාකරණය ප්‍රධාන වශයෙන් මෙහෙයවනු ලැබීය.

■ මැතිවරණයට ඉදිරිපත් වූ අපේක්ෂිකාවන් පිළිබඳව සිංහල හා දෙමළ මාධ්‍ය තුළ මැතිවරණයට පෙර විශාල ආවරණයක් තිබුණි. මෙම මාධ්‍ය ආවරණයට සමහර අපේක්ෂිකාවන් පිළිබඳ විස්තර සහ ඔවුන් තරඟ කිරීමට හේතුව, ඔවුන්ව තෝරාගතහොත් ඔවුන් දියත් කිරීමට සැළසුම් කර ඇති දේ ආදිය පිළිබඳව අදහස් දක්වන සම්මුඛ සාකච්ඡා හෝ විශේෂාංග ඇතුළත් විය. මෙවැනි ආකාර වූ ආවරණයක් ඉංග්‍රීසි පුවත්පත්වල දක්නට නොලැබුණි. මෙම ලිපි මඟින් වෙනත් රටවල් හා සංසන්දනාත්මකව ශ්‍රී ලංකාවේ පාලන ව්‍යුහය තුළ කාන්තා නියෝජනය, ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ දේශපාලන ඉතිහාසය සහ ශ්‍රී ලංකාවට කෝටාවේ ඇති වැදගත්කම පිළිබඳව සාකච්ඡා කර තිබුණි.

■ දෙමළ මාධ්‍ය පුවත්පත් විශේෂයෙන් ම තේ වතු ක්ෂේත්‍රයේ කාන්තාවන් මැතිවරණයට ඉදිරිපත් වීමේ වැදගත්කම අවධාරණය කළ අතර දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීමට සහ වැවිලි අංශය නියෝජනය කිරීම සඳහා තරඟ කිරීමට ඔවුන්ව දිරිමත් කරන ලදී. සමහර සම්මුඛ සාකච්ඡා සහ විශේෂාංග මගින් කෝටාව පමණක් කාන්තාවන්ට වතු ක්ෂේත්‍රයෙන් තරඟ කිරීමට උදව් නොවන බව පෙන්වා දී තිබුණි. ඒ, ඔවුන් ජීවත් වන පීතෘමූලික සමාජය කිසි විටෙකත් ඔවුන්ට දේශපාලනික වශයෙන් පමණක් නොව නායකත්ව තනතුරු ද ලබා දී නොමැති නිසාවෙනි. එම නිසා දේශපාලන පක්ෂවලට නායකත්ව සංවර්ධනය සඳහා ආයෝජනය කිරීමට සිදුවනු ඇත. සමස්තයක් ලෙස ගත්විට, දෙමළ මාධ්‍යවල දේශපාලන පක්ෂ හා කාන්තා දේශපාලනඥයින් සමඟ කෝටාවේ ඇති වැදගත්කම සහ / හෝ මැතිවරණ සඳහා තරඟ කරන කාන්තාවන් මුහුණ දෙන ගැටලු පිළිබඳව වැඩිපුර සම්මුඛ සාකච්ඡා පළකර තිබුණි.

- පනතේ විධිවිධානවලට අනුව 25% කෝටාව සපුරා ගැනීමට සභා කිහිපයකට නොහැකි වූ නිසා සභාව පිහිටුවීම ඉදිරියට ගෙන යාමට නොහැකි වූ බැවින්, මැතිවරණයට පසුව මාධ්‍ය ආවරණයෙන් බහුතරයක් කෝටාව ක්‍රියාත්මක කිරීමේ දුෂ්කරතාවය පිළිබඳව සාකච්ඡා කර තිබුණි. මැතිවරණ කොමිසමේ සභාපතිවරයාගේ ප්‍රකාශ සහ සම්මුඛ සාකච්ඡාවලදී ලැයිස්තු දෙකේ ක්‍රමවේදය මෙම ප්‍රෙහේලිකාවට බලපෑ කාරණය ලෙස දෝෂදර්ශනයට භාජනය විය. කාලය ගෙවී යත්ම, මාධ්‍ය ආවරණය කෝටාවේ අනාගතය වටා භ්‍රමණය විය. මීළඟ මැතිවරණය සඳහා කෝටාව ක්‍රියාත්මක කිරීමට පෙර මෙම මැතිවරණයෙන් පාඩම් ඉගෙන ගත යුතු බව සමහර සාකච්ඡාවල සඳහන් විය. එම ලිපි නීතියේ පැහැදිලිතාවයක් ඇතිකිරීම සඳහා නීතිය සංශෝධනය කළ යුතු බව පෙන්වා දී තිබුණි. තවත් සමහරෙක් කෝටාව ප්‍රායෝගික නොවන බව සහතික කර ප්‍රකාශ කළෝය. පළාත්පාලන හා පළාත් සභා ඇමති මුස්තාපා මහතා සහ කොළඹ නගරසභාවේ නගරාධිපති රෝසි සේනානායක මහත්මිය වැනි ප්‍රධාන පුද්ගලයින් කෝටාවට සහය පළ කරමින් ප්‍රකාශ නිකුත් කරන ලද අතර අමාත්‍ය මුස්තාපා මහතා විසින් කාන්තාවන් සඳහා වන 25% කෝටාව අඩු කිරීමට තමන් හිස නොනමන බව ප්‍රකාශ කළේය. මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති මහින්ද දේශප්‍රිය මහතා මෙම නීතිමය වංචාවන් පිළිබඳව මුල සිටම නීතිපතිවරයාට අනතුරු ඇඟවූ බව ප්‍රකාශ කළේය.
- සිංහල හා දෙමළ මාධ්‍යයන්හි, වඩාත් කැපී පෙනෙන ලෙස, ලංකාදීප (ලිපි 7ක්), වීරකේසරි (ලිපි 16ක්) සහ තිනකරන් (ලිපි 6ක්) යන පුවත්පත්වල, ප්‍රාදේශීය සභාවල කෝටා ක්‍රියාත්මක කිරීම සිදු වන්නේ කෙසේද යන්න පිළිබඳ පසු විපරම් පුවත් රාශියක් පළවිය. මෙම පුවත්වලට සමාරම්භක රැස්වීම්, දිවයින පුරා පිහිටා තිබෙන විවිධ පළාත් පාලන ආයතනවල සුවිශේෂිත වාර්තා ඇතුළත් විය. මෙම රැස්වීම් වාර්තාවල ගන්නා ලද තීරණ, මන්ත්‍රීවරියන් අදහස් ප්‍රකාශ කළ ආකාරය සහ පොදුවේ ඔවුනගේ සහභාගීත්වය අන්තර්ගත විය. දෙමළ මාධ්‍ය විසින් අලුතින් තේරී පත් වූ මන්ත්‍රීවරියන් සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන් සමග පශ්චාත් මැතිවරණ අත්දැකීම් සහ කෝටාවේ සාර්ථකත්වය පිළිබඳව සම්මුඛ සාකච්ඡා රාශියක් පවත්වා තිබේ.
- පුවත්පත් හෝ මාධ්‍ය ආයතන සාමාන්‍යයෙන් මැතිවරණ නිරීක්ෂණ ආයතනවල කටයුතුවලින් විශාල ලෙස ප්‍රතිලාභ ලබන බව පැහැදිලිය. මැතිවරණ ප්‍රචණ්ඩත්වය පිළිබඳ බොහෝ ආවරණ මෙන්ම නීති කඩකර ඇති ආකාරය සහ ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු මෙම කණ්ඩායම් විසින් නැවත නැවත අවධාරණය කර වාර්තා කර තිබුණි. කෙසේ වෙතත්, දෙමළ මාධ්‍ය හා සසඳන විට ඉංග්‍රීසි මාධ්‍ය තුළ වාර්තා කිරීම නිතර නිතර සිදු වුණි. මෙයින් පැහැදිලි වන්නේ නිරීක්ෂණ ආයතන විසින් භාෂා තුනෙන්ම තොරතුරු ගලායාම සහතික කළ යුතු බවත්, මැතිවරණ කාලවල දී කරනු ලබන වාර්තා කිරීම්වල දී දෙමළ මාධ්‍ය ආයතන ස්වාධීන නිරීක්ෂණ ආයතනවල වාර්තා වැඩි වශයෙන් භාවිතා කළ යුතු බවත්ය.
- පුවත්පත් වාර්තාකරුවන් විසින්ම කරනු ලබන විශ්ලේෂණයන් ඉතා අල්ප වන අතර සැලකිය යුතු විශ්ලේෂණයන් බොහෝමයක් ලැබෙන්නේ සිවිල් සමාජ සංවිධානවලින් හෝ ක්‍රියාකාරීන් / ප්‍රතිපත්ති සම්පාදකයින් සමග කරනු ලබන සම්මුඛ සාකච්ඡා හරහාය. නිදසුනක් වශයෙන්, ඉංග්‍රීසි පුවත්පත්වල පුළුල් ලෙස පළ කරන ලද කාන්තා ක්‍රියාකාරී ජාලයේ ප්‍රකාශයන් අපේක්ෂිකාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය, විශේෂයෙන් මුස්ලිම් අපේක්ෂිකාවන් සහ ඔන්ලයින් වෛරී ප්‍රකාශන දැකිය යුතු ආකාරය පිළිබඳව සාකච්ඡා කරයි. එවැනි ප්‍රකාශ සහ සම්මුඛ සාකච්ඡාවලින් පිටත එවන් ගැඹුරු විශ්ලේෂණයන් දක්නට නොමැත.
- අපේක්ෂිකාවන්ගේ සුදුසුකම් සහ යෝග්‍යතාවය සාකච්ඡා කළ වාර්තා කිරීම්වල දී සම්මුඛ සාකච්ඡාවලට සහභාගීවූවන්ගෙන් බහුතරයක් අපේක්ෂිකාවන් දේශපාලනඥයෙකුගේ මවක්, සහෝදරියක් හෝ බිරිඳක් නොවී අධ්‍යාපනය හා සුදුසුකම් ලත් පුද්ගලයින් විය යුතු බවත් ප්‍රකාශ කළෝය. කෙසේ වෙතත්, පිරිමින් එවැනි ප්‍රමිතියකට යටත් කර ඇත්දැයි යන්න සාකච්ඡා කරන වෙනස් ආඛ්‍යානයක් හෝ විශ්ලේෂණයක් සහිත කිසිම සම්මුඛ සාකච්ඡාවක් හෝ ලිපියක් නොතිබුණි. ඒවාගේම, පලාත් පාලන ආයතනවල සිටින පිරිමින්ගේ හෝ අපේක්ෂකයින්ගේ යෝග්‍යතාවය ප්‍රශ්න කරන හෝ දේශපාලන සංස්කෘතිය තුළ ගැඹුරින් මුල්බැස පවතින ඥාති සංග්‍රහය වැනි කාරණාවන් සම්බන්ධයෙන් ද අවධානය යොමුකර නොතිබුණි.
- මැතිවරණයට පෙර ඇතැම් මාසවල දී, බොහෝ සතිපතා පුවත්පත්වල කෝටාව හෝ කාන්තා නියෝජනය පිළිබඳව ආවරණයක් නොතිබුණි. දෛනික පුවත්පත් හා සසඳන විට ජනතාව සතිපතා පුවත්පත් කියවීමට වැඩි නැඹුරුවක් දක්වන බැවින් ගැඹුරු විශ්ලේෂණයක් සහිත ලිපි මෙන්ම විශේෂාංග ලිපි ද එම පුවත්පත්වල තිබීම වැදගත් වේ.

# හැඳින්වීම

මෙම වාර්තාව, ආකල්ප (මනස) වෙනස් කිරීම: සියලු ජන කණ්ඩායම් ඇතුළත් වන ආකාරයෙන් පාලනය කිරීම සහ දේශපාලනයේ කාන්තා නියෝජනය වැඩි කිරීම සඳහා ගනු ලබන ස්ථිරසාර ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම සඳහා කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය නිරත වී සිටින කාර්යයන්ගේ එක් අංගයකි. පළාත් පාලනය තුළ (පළාත් පාලන ආයතනවල) කාන්තාවන් සඳහා හඳුන්වා දෙන ලද 25% කෝටාවට ප්‍රතිචාර දැක්වීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳව කරන ලද මෙම පුවත්පත් පර්යේෂණයේ අරමුණ වූයේ දේශපාලනය තුළ කාන්තාවන්ගේ නියෝජනය පිළිබඳ දැනුම ගොඩනැගීමත් හා බෙදාගැනීමත් ඒ සම්බන්ධව ප්‍රතිපත්තිමය හා ප්‍රායෝගිකව ස්ථිරසාර ක්‍රියාමාර්ග වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දීමත් වේ.

කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය විසින් දේශපාලනයේ කාන්තාව සම්බන්ධයෙන් කරගෙන යන සමස්ත කාර්යය දේශපාලන ආයතනවල කාන්තාවන්ගේ නියෝජනය සම්බන්ධව ශ්‍රී ලංකාව තුළ ප්‍රජාතන්ත්‍රවාදී හා සදාචාරාත්මක දේශපාලන සංස්කෘතියක් ගොඩනැගීමට බලපාන ප්‍රධාන අභියෝග තුනක් ආමන්ත්‍රණය කිරීමට ප්‍රයත්න දරයි. පළමුවැන්න නම් දේශපාලනයේ අඩු කාන්තා නියෝජනය සහ කාන්තාවන්ගේ දේශපාලන නියෝජනය වැඩි කිරීම සම්බන්ධව ප්‍රසිද්ධ කතිකාවක් ගොඩනැගීමේ අවශ්‍යතාවයයි. දෙවැන්න, කාන්තාවන්ගේ දේශපාලන සහභාගීත්වය පිළිබඳ ගැටළුව සහ ව්‍යවස්ථාදායක දේශපාලනයද ඇතුළත්ව දේශපාලනයේ නිරතවීම සඳහා කාන්තාවන් සතු හැකියාව පිළිබඳ ජනතාව සිතන ආකාරය හා සම්බන්ධ වේ. එම නිසා
ව්‍යවස්ථාදායකය තුළ කාන්තාවන්ගේ මැදිහත්වීම ශක්තිමත් කිරීමේ ගැටලුව ආමන්ත්‍රණය කිරීමේ අවශ්‍යතාවය පවතී. තෙවැන්න පළාත් පාලන ආයතන වෙත තේරී පත්වන වැඩිවන කාන්තා නියෝජිතයින්ගේ (වර්තමානයේ පවතින 2%සිට 25% දක්වා වැඩිවීමක්) හැකියාව වර්ධනය කිරීමය. මොවුන්ගෙන් බහුතරයක් පළාත් පාලනයට නවකයෝය.

2017 පළාත් පාලන මැතිවරණ පනතට කරන ලද සංශෝධනයක් (2017 අංක 16 දරණ පළාත් පාලන මැතිවරණ (සංශෝධන) පනත) මගින් සමානුපාතික නියෝජන ක්‍රමයකට අනුව පළාත් පාලන නියෝජිතයින් තෝරා පත් කර ගැනීම සහතික කරන ලදී. සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ සමාජිකයින්ගෙන් 60**%** ක් තනි සාමාජික හෝ බහු සාමාජික කොට්ඨාශ නියෝජනය කරන අතර 40% ක් අතිරේක පුද්ගලයින් ලෙස නම් කර ඇති
ලයිස්තුවෙන් තෝරාගනු ලැබේ. පළාත්පාලන ආයතනවල මුළු සාමාජික සංඛ්‍යාව 4486 සිට ආසන්න වශයෙන් සාමාජිකයන් 8356 දක්වා වැඩි කරන ලදී. සංශෝධනයේ 27 එෆ් වගන්තිය ප්‍රකාරව, සෑම පළාත් පාලන ආයතනයකම සිටින මුළු සාමාජික සංඛ්‍යාවෙන් 25**%** ක් කාන්තා සාමාජිකාවන් විය යුතුය[1]. පළාත් පාලන ආයතන ආසනවලින් 25 ක් කාන්තාවන්ට තහවුරු කරන 2017 පළාත් පාලන ආයතන මැතිවරණ පනතේ මෙම සහතික කිරීමේ ප්‍රතිපාදන මෙම අධ්‍යයනයේ දී කාන්තා කෝටාව හෝ කෝටාව ලෙස හැඳින්වේ. කෝටාව ක්‍රියාත්මක වීමත් සමඟම, 2018 පෙබරවාරි 10 වන දින පළාත් පාලන මැතිවරණයෙන් පසුව පළාත් පාලන ආයතනවල කාන්තාවන්ගේ සංඛ්‍යාව 89 සිට 1991[2] දක්වා වැඩි විය. 2018 මැතිවරණයෙන් රෝසි සේනානායක මහත්මිය කොළඹ මහ නගර සභාවට තේරී පත්වූ ප්‍රථම නගරාධිපතිනිය විය[3].
මෙම වාර්තාව සඳහා පර්යේෂණ කටයුතු ක්ෂමා රණවන, තුෂාරි මඩහපොල සහ විලූතු, මානව සම්පත් සංවර්ධන මධ්‍යස්ථානය විසින් කරන ලදී.

1. https://groundviews.org/2018/02/07/the-significance-of-the-25-quota-for-women-in-local-government/
2. https://www.colombotelegraph.com/index.php/governments-womens-quota-a-total-success/
3. https://www.democracyspeaks.org/blog/empowering-female-councilors-sri-lanka

# ක්‍රමවේදය

මෙම අධ්‍යයනයෙන් 2017 සැප්තැම්බර් - 2018 දෙසැම්බර් කාලය තුළ පළ කරන ලද පුවත්පත් වාර්තාකරණය ආවරණය විය. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන සෑම භාෂා කාණ්ඩයකම දිනපතා පුවත්පත් දෙකක් සහ සති අන්ත පුවත්පත් දෙක බැගින් පුවත්පත් හතරක් තෝරා ගන්නා ලදී. රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍ය ඇතුළත්ව ප්‍රධාන ධාරාවේ මාධ්‍ය වාර්තා ග්‍රහණය කර ගැනීමේ අරමුණින් පුවත්පත් හඳුනා ගැනීම කරන ලදී.

| | සති අන්ත | සති අන්ත | දිනපතා | දිනපතා |
|---|---|---|---|---|
| ඉංග්‍රීසි | සන්ඩේ ටයිම්ස් | සන්ඩේ ඔබ්සර්වර් * | ඩේලි මිරර් | ඩේලි නිවුස් * |
| සිංහල | ඉරිදා ලංකාදීප | සිළුමිණ* | දිනමිණ | ලංකාදීප* |
| දෙමළ | ඉරිදා වීරකේසරි | ඉරිදා තිනකරන් * | වීරකේසරි | තිනකරන් * |

වගුව 1: රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍යවලින් තෝරාගත් පුවත්පත්
*රාජ්‍ය මාධ්‍ය

පර්යේෂකාවන් තිදෙනෙක්, 2019 ජනවාරි සිට 2019 සැප්තැම්බර් දක්වා කාලය තුළ එක් එක් භාෂාවෙන් පළවූ සියලු ම පුවත්පත් විමර්ශනය කර තොරතුරු එක්රැස් කිරීමේ කාර්යයේ නිරත වූවෝය. මෙම පුවත්පත් කොළඹ මහජන පුස්තකාලය, ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාලය, කාන්තාව සහ මාධ්‍ය සාමූහිකයේ කාර්යාලයෙන් ලබා ගත හැකි පිටපත් මෙන්ම විලුනු වැනි වෙනත් සංවිධානවලින් ලබා ගත හැකි පිටපත් සහ එම පුවත්පත්වල ඔන්ලයින් පිටපත් වෙත ප්‍රවේශ වී ඔවුහු ආසන්න වශයෙන් පුවත්පත් 2900 ක් විමර්ශනය කළහ.

මහජන පුස්තකාලයේ සහ ජාතික පුස්තකාලයේ පුවත්පත් ලේඛනාගාරය භාවිතා කිරීම සඳහා පර්යේෂිකාවන්ට සාමාජික කාඩ්පතක් ලබා ගැනීමට සිදු විය. මෙම ආයතන දෙකේ ලේඛනාගාරය භාවිතා කිරීමේ දී ඔවුන් මුහුණදුන් අභියෝග සමහරක් මෙහි සඳහන් කිරීම වැදගත් වේ. (අ) වරකට මාසයකට පමණක් පුවත්පත් වෙත පිවිසිය හැකිවීම (ආ) මහජන පුස්තකාලය ප්‍රකාශයට පත් කිරීමෙන් වසරකට පසු පුවත්පත් ගබඩා කර නොමැතිවීම (ඇ) ජාතික පුස්තකාලය පුද්ගලයෙකුට කලින් තීරණය කළ පුවත්පත් සංඛ්‍යාවක් කියවීමට පමණක් අවසර දී ඇති අතර ඉන් පසුව තවත් පුවත්පත් වෙත ප්‍රවේශ වීම සඳහා ගෙවීමක් කළ යුතු විය. (ඈ) මෙම ස්ථාන දෙක ලැප්ටොප් පරිගණක භාවිතය සඳහා අවසර දී තිබුණද, 2019 අප්‍රියෙල් 21 බෝම්බ පිපිරීමෙන් පසුව මෙය අත්හිටුවන ලදී. මෙම ස්ථාන දෙකෙහිම අමුත්තන් සඳහා වයි-ෆයි සම්බන්ධතාවයක් නොතිබූ අතර එයින් අදහස් කළේ තොරතුරු එක්රැස් කිරීමෙන් පසුව, පර්යේෂකයා නිවසේ දී අන්තර්ජාලය හරහා ප්‍රවෘත්ති පරීක්ෂා කළ යුතු බවයි.

පුවත්පත් ලිපි කියවා ලබාගත් තොරතුරු එසැනින් ම එක්සෙල් දත්ත ගබඩාවකට ඇතුළත් කරන ලදී. එක්සෙල් දත්ත සමුදාය පහත තොරතුරු රැස් කළේය -

අ) පුවත්පතේ නම, ප්‍රකාශයට පත් කළ දිනය, ලිපි වර්ගය (ප්‍රවෘත්ති ලිපිය, විශේෂාංගය, සම්මුඛ පරීක්ෂණය ආදිය), පිටු අංකය වැනි මූලික තොරතුරු.

ආ) එක් එක් ලිපියේ සාරාංශයක්, එම ලිපියේ සඳහන් දේ හෝ කියනු ලැබූ දේ සහ ප්‍රධාන උපුටා දැක්වීම්, මැතිවරණ නීති උල්ලංඝණය කිරීම්, ප්‍රචාරක කටයුතු පිළිබඳ තොරතුරු, කෝටාව සම්බන්ධ ගැටළු, කෝටාව ක්‍රියාත්මක කිරීම, සහ කෝටාවේ අනාගතය යන කාණ්ඩවලට වැටී ඇත්ද වැනි විස්තරාත්මක තොරතුරු

# ප්‍රධාන සොයා ගැනීම්


2017 සැප්තැම්බර් - 2018 දෙසැම්බර් දක්වා වූ පර්යේෂණ කාලය තුළ, කාන්තා කෝටාවට අදාළ හෝ ඒ හා සම්බන්ධ වූ ලිපි 415 ක් භාෂා තුනෙන් ම පළවූ විමර්ශනය කරන ලද පුවත්පත් දොළහ තුළ ප්‍රකාශයට පත් කර තිබුණි. ඉන් 117 ක් ඉංග්‍රීසි පුවත්පත්වල ද, 148 සිංහල හා 150 ක් දමිළ භාෂා පුවත්පත්වල ද විය. කාන්තා කෝටාව ගැන සඳහන් කරන හෝ ඒ ගැන පළ වූ ලිපි ගණන 2018 පෙබරවාරි මැතිවරණයට පෙර මාස කිහිපය තුළ වැඩියෙන් තිබූ අතර එය 2018 පෙබරවාරි මාසයේ ඉහළ ම අගයක් ගෙන ඊළඟ මාසවල දී ක්‍රමෙන් අඩු විය.

*(1 වන ප්‍රස්තාරය බලන්න)*


පුවත්පත් විසින් පළ කරන ලද ලිපි ගණන විශ්ලේෂණය කිරීමේ දී භාෂා තුනෙන් ම පළ වූ සති අන්ත පුවත්පත්වල ලිපි සමාන සංඛ්‍යාවක් විය. දිනපතා පුවත්පත් අතර දෙමළ භාෂාවෙන් පළවූ පුවත්පත්වල කාන්තා කෝටාව හෝ ඒ හා සම්බන්ධ ලිපි වැඩි ප්‍රමාණයක් පළ කර තිබුණි. සිංහල භාෂාවෙන් වූ පුවත්පත්වල මීට සමීප අගයකින් යුත් ලිපි පළකර තිබුණි.

*(2 වන ප්‍රස්තාරය බලන්න.)*

1 වන ප්‍රස්තාරයඃ ලිපි ගණන සැප්තැම්බර් 2017 - දෙසැම්බර් 2018




2 වන ප්‍රස්තාරය: පුවත්පත් වශයෙන් පළ වූ ලිපි ගණන




මෙම කාල සීමාව තුළ ප්‍රකාශයට පත් කරන ලද ලිපි වර්ග දෙස බලන විට, ලිපිවලින් අඩකට වඩා ප්‍රවෘත්ති වාර්තා (ලිපි 242) විය. ඉන් අනතුරුව විශේෂාංග ලිපි 79 ක් ද, සම්මුඛ සාකච්ඡා 43 ක් ද, අදහස් 28 ක් සහ කතුවැකි 23 ක් පළකර තිබුණි (3 වන ප්‍රස්තාරය බලන්න).


3 වන  වන ප්‍රස්තාරය: ලිපි වර්ගය




පර්යේෂණ කාලය තුළ ලියන ලද ලිපි/වාර්තා 415 න් වාර්තා 30 ක් පුවත්පතේ මුල් පිටුවේ පළ විය. ඉංග්‍රීසි පුවත්පත්වල වාර්තා 15 ක් පළකර තිබුණ අතර එයින් 9 ක්ම 2018 පෙබරවාරි මාසයේදී පළකර තිබුණි.  සිංහල පුවත්පත්වල පළ වූ වාර්තා 9 න් 6 ක් ම 2018 පෙබරවාරි මාසයේ ද දෙමළ පුවත්පත්වල පළ වූ වාර්තා 6 න් 3 ක් 2018 ජනවාරි මාසයේ දී පළකර තිබුණි (4 වන ප්‍රස්තාරය බලන්න). මෙම කාලය තුළ වීරකේසරි පුවත්පතෙහි හැර අනෙකුත් සතිපතා පුවත්පත්වල කිසිම පිටුවක මුල් පිටුවේ වාර්තාවක් නොතිබීම සැලකිය යුතු කරුණකි. 2018 අප්‍රියෙල් මාසයේ දී ඉරිදා වීරකේසරි පුවත්පතේ මස්කෙලිය ප්‍රාදේශීය සභාවේ ප්‍රථම සභාපතිවරිය පිළිබඳව පිටුවක ලිපියක් පළ විය.

ඉංග්‍රීසි පුවත්පත්වල, විශේෂයෙන් ම 2018 පෙබරවාරි මාසයේ දී හා මැතිවරණයෙන් පසු මුල් පිටුවේ පළ වූ ලිපි බොහොමයක්, ප්‍රාදේශීය සභා පිහිටුවීමේ ප්‍රමාදය සම්බන්ධයෙන් විය. එම ලිපිවලින් ප්‍රමාද වීමට හේතු පිළිබඳව මහින්ද දේශප්‍රිය මහතා සමඟ පවත්වන ලද සම්මුඛ සාකච්ඡා, පළාත් පාලන ආයතන ප්‍රමාදයකින් තොරව පිහිටුවන බවට සහතික වන ලෙස මැතිවරණ කොමසාරිස්වරයාගෙන් ඉල්ලා සිටීම, කෝටාව ක්‍රියාත්මක කිරීමේ දී ඇති වූ නීතිමය බාධා, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍ය ෆයිසර් මුස්තාපා මහතා කෝටාව පිළිපැදීමට මැතිවරණ කොමිසම විසින් පක්ෂවලට නියෝග කළ යුතු බව ප්‍රකාශ කර සිටීම ආදිය සම්බන්ධයෙන් අවධානය යොමු කර තිබුණි. මැතිවරණයට පෙර මාසවල (2017 දෙසැම්බර් සහ 2018 ජනවාරි) මුල් පිටුවල පළ කරන ලද වාර්තාවල මැතිවරණ ප්‍රචණ්ඩත්වයට අදාළ තොරතුරු, මැතිවරණ පැවැත්වීම, 2017 අංක 16 පළාත් පාලන මැතිවරණ (සංශෝධන) පනත ගැසට් කිරීමට අදාළ ප්‍රවෘත්ති ඇතුළත් විය. පෙබරවාරි මාසයේ දී පළමු ‘ආදිවාසී’ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරිය වන දෙහිඅත්තකණ්ඩියේ ඩබ්ලිව්. එම්. ශිරෝමාලා පිළිබඳව ප්‍රවෘත්තියක් මුල් පිටුවේ පළවිය[4]. කෝටාව ක්‍රියාත්මක කිරීමේ දී මැතිවරණයෙන් පසු සභා පිහිටුවීමේ දී ඇති වූ ගැටලු මෙන්ම මැතිවරණය ක්‍රියාවලියේ යෙදී සිටින අතරතුර කාන්තාවන් මුහුණ දුන් ප්‍රචණ්ඩත්වය සහ අපයෝජනය පිළිබඳ ප්‍රවෘත්ති ද සිංහල පුවත්පත්වල මුල් පිටුවල වාර්තා අතර විය. දෙමළ පුවත්පත්වල, කැෆේ සංවිධානයේ විධායක අධ්‍යක්ෂකවරයා උපුටා දක්වමින් උතුරේ දේශපාලන පක්ෂ සඳහා කාන්තාවන්ට ප්‍රමුඛත්වය දීමේ වැදගත්කම මෙන්ම කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අඩු මට්ටමක පැවතීම පිළිබඳව මුල් පිටුවේ වාර්තා වී තිබුණි. උතුරේ කාන්තාවන් ප්‍රාදේශීය සභාවලට තේරී පත්වීමේ වැදගත්කම පිළිබඳව කාන්තා අපේක්ෂිකාවන් දක්වන ලද අදහස් සහිත ප්‍රවෘත්ති ද මුල් පිටුවේ පළ විය.

4 වන වන ප්‍රස්තාරය: මුල් පිටුවේ ලිපි




*4 http://www.dailymirror.lk/article/Shiromala-first-Adiwasi-public-representative-145742.html*

# පුවත්පත් වාර්තා කළේ කෙසේද ?

2017 සැප්තැම්බර් සිට 2018 දෙසැම්බර් දක්වා පුවත්පත් වාර්තාකරණය දෙස බලන විට කාන්තා කෝටාව ක්‍රියාත්මක කිරීම ආවරණය කිරීම ප්‍රධාන අදියර තුනකට බෙදිය හැකිය. පළමු වැන්න නම් 2017 සැප්තැම්බර් - දෙසැම්බර් කාල පරිච්ඡේදය. මේ කාලයේ දී 2017 අංක 16 දරණ පළාත් පාලන ආයතන මැතිවරණ (සංශෝධන) පනතත් 2018 පෙබරවාරි මාසයේ පැවැත්වීමට නියමිත වූ 25% කෝටාව ක්‍රියාත්මක කරන පළමු මැතිවරණය ප්‍රකාශයට පත් කිරීමත් සිදුවිය. දෙවැන්න නම්, 2017 දෙසැම්බර් - පෙබරවාරි 2018 කාලයයි. පෙබරවාරි මාසයේ පැවැත්වීමට නියමිත මැතිවරණය සහ ඊට පෙර වකවානුව තුළ සිදු වූ මැතිවරණ ප්‍රචාරක කටයුතු හා ඒ හා සම්බන්ධ ගැටළු මෙම කාලය තුළ දී ආවරණය තර ඇත. තෙවැන්න නම් පශ්චාත් මැතිවරණය කාල පරිච්ඡේදයයි. මෙම කාලයේ දී කෝටාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ගැටළු සහ සියලු සභාවන්ට 25% ක නියෝජනයක් ඇති බව සහතික කිරීමේ දුෂ්කරතා පිළිබඳව වැඩි ආවරණයක් කර ඇත.

**පළමු අදියර (2017 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා)**

"කලින් පළාත් පාලන මැතිවරණ නීතිය වෙනුවට නව නීති සම්පාදනය කිරීම ප්‍රජාතන්ත්‍රවාදයේ දියුණුවක්. පළමු වතාවට පළාත් පාලන ආයතනවලට 25% කාන්තා නියෝජනයක් සහතික කර තිබේ. පුරුෂයින් ආධිපත්‍යය දරණ දේශපාලන පක්ෂ පවතින සහ කාන්තාවන්ගේ දේශපාලන ක්‍රියාකාරකම් සඳහා සංස්කෘතික බාධාවන් පවතින සන්දර්භයක් තුළ එවැනි අනිවාර්ය කෝටාවක් අවශ්‍ය වේ. එමගින් කුප්‍රකට මනාප ඡන්ද ක්‍රමයෙන් ඉවත් වී සරල බහුතර ඡන්ද ක්‍රමය සමග ඒකාබද්ධ කර සමානුපාතික නියෝජනයේ වාසි රඳවා තබා ගෙන දෙමුහුන් ක්‍රමයක් ඉදිරිපත් කරනු ලැබේ. මනාප ඡන්දය අහෝසි කිරීමෙන් මැතිවරණයක යෙදීම වඩාත් ලාභදායී කරන අතර මිළ මුදල් අහිමි අපේක්ෂිකාවන්ට මැතිවරණයට ප්‍රවේශ විය හැකි තත්ත්වයක් උදාකර දේ. එමෙන්ම මුදල් මලු මත යැපීම ද අඩු කරනු ලබයි. "

*ඩේලි නිවුස් විශේෂාංගය, 2017 සැප්තැම්බර්* [5]

පළාත් පාලන ආයතන මට්ටමින් කාන්තාවන් සඳහා 25% කෝටාව නීතිගත කළ 2017 අංක 16 දරණ පළාත් පාලන මැතිවරණ (සංශෝධන) පනතෙන් අනතුරුව 2017 සැප්තැම්බර් මාසයේ දී පාර්ලිමේන්තුව විසින් පළාත් සභා මැතිවරණය (සංශෝධනය) සම්මත කරන ලදී. කුමන වෙනස්කම් (පළාත් පාලන ආයතන පනත[6]) ගෙන එනු ඇත්ද යන්න පුවත්පත් ආවරණය විස්තරාත්මකව වාර්තා කළ අතර සම්මුඛ සාකච්ඡාවලට භාජනය වූ බොහෝ දෙනෙක් මෙම වෙනස ප්‍රගතිශීලී යැයි ප්‍රශංසා ලක් කළෝය. පළාත් පාලන හා පළාත් සභා අමාත්‍ය ෆයිසර් මුස්තාපා මහතා මෙම ලිපිවල වැඩිපුරම සම්මුඛ සාකච්ඡාවලට හෝ උපුටා ගැනීමවලට භාජනය වූ අතර ඔහු සංශෝධනවල වඩාත් වැදගත් අංග ආරක්ෂා කරන මෙන් දේශපාලන පක්ෂවලින් ඉල්ලා සිටියේය. කාන්තා කෝටාවේ වැදගත්කම පිළිබඳව කථා කළ පැවති රජයේ අනෙකුත් සාමාජිකයින් සමඟ කරන ලද සම්මුඛ සාකච්ඡා කිහිපයක් සහිත ලිපි ද පළකර තිබුණි.

5 http://www.dailynews.lk/2017/09/08/features/127589/lg-polls-and-local-interests
6 In this study we concentrated particularly on reportage of the Amendments to the Local Authorities Act.

"ආර්ථිකයේ ප්‍රධාන අංගයක් වන කාන්තාවන් ආර්ථික ක්ෂේත්‍රයේ උසස් තැන්වලට ගොස් තිබේ. කාන්තාවන් ආර්ථිකය ශක්තිමත් කර තිබෙන්නාක් මෙන් දේශපාලන බලය ද ශක්තිමත් කරනු ඇත. රජයේ අරමුණ වන්නේ ද මෙයයි. කාන්තාවන්ගේ නියෝජනය 25% ක් ලබා දෙන අතර දේශපාලන ක්ෂේත්‍රයේ ඔවුන්ට ශක්තියක් ලබා දේ. "

*අගමැති රනිල් වික්‍රමසිංහ මහතා 2017 සැප්තැම්බර් මස 1 වන දින කාන්තාවන් සවිබල ගැන්වීමේ සම්මාන උළෙල අමතමින් උපුටා ගත්තේ 2017 සැප්තැම්බර් මස 05 වන දින පළ වූ ලංකාදීප පුවත්පත.*

පනත සම්මත කිරීම සම්බන්ධයෙන් කාන්තාවන් සම්මුඛ සාකච්ඡාවලට භාජනය කර නොතිබුණි. භාෂා තුනෙන් ම තිබූ උපුටනයන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කෝටාවේ වැදගත්කම පිළිබඳව දැක් වූ අදහස් විය. භාෂා තුනෙන්ම පළවූ බොහොමයක් ලිපි, ලොව ප්‍රථම අග්‍රාමාත්‍යවරිය සහ ප්‍රථම ජනාධිපතිවරිය ශ්‍රී ලංකාවෙන් බිහිවී තිබියදීත්, ප්‍රාදේශීය, පළාත් සහ පාර්ලිමේන්තු යන සෑම මට්ටමකදී ම කාන්තා නියෝජනය දකුණු ආසියානු කලාපයට සාපේක්ෂව ඉතාමත් අසතුටුදායක තත්ත්වයක පවතින බව පෙන්වා දී තිබේ. සන්ඩේ ඔබ්සර්වර් පුවත්පත 2017 සැප්තැම්බර් 3 වන දින ප්‍රකාශයට පත් කළ ලිපියක මාධ්‍ය හමුවකින් අනතුරුව හිටපු අමාත්‍ය සුදර්ශණී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය කරන ලද ප්‍රකාශයක් උපුටා දක්වා තිබුණි. එහිදී ඇය කාන්තාවන් සඳහා 25% ක් ඉල්ලා සිටි අතර, ආසන 1400 ක් හෝ කාන්තාවන් සඳහා 16% ක් පමණක් වෙන් කළ කලින් පැවති විධිවිධානයට එරෙහිව ඡන්දය ලබාදෙන බව ද එම ලිපියේ වාර්තා කර තිබුණි.

"පළාත් පාලන ආයතනවල කාන්තාවන්ගේ නියෝජනය වැඩි වුවහොත් රට තුළ වෙනසක් සිදු වනු ඇත. වෙනත් රටවල කාන්තාවන්ගේ දේශපාලන නියෝජනය ඉහළ මට්ටමක පවතින නමුත් අනෙක් රටවල් මෙන් නොව ශ්‍රී ලංකාවේ දේශපාලනයේ කාන්තා සහභාගීත්වය අඩු ය. "

*තිනකරන් පුවත් ලිපිය, 2017 නොවැම්බර්*

පීතෘමූලික දේශපාලන ක්‍රමයක් හා දේශපාලන පක්ෂ ක්‍රමයක් යටතේ තරඟ කිරීමේදී කාන්තාවන් මුහුණ දෙන අභියෝග පිළිබඳව සාකච්ඡා කෙරෙන ලිපි කිහිපයක් ද විය. මේවා බොහොමයක් සිංහල හා ඉංග්‍රීසි පුවත්පත්වල පළ විය. කෝටාවේ අවාසිදායක පැති පිළිබඳව විපක්ෂයේ ඇමතිවරුන් හෝ විපක්ෂයේ දේශපාලනඥයන් හෝ ජ්‍යෙෂ්ට පුවත්පත් කලාවේදීන් හා විශ්ව විද්‍යාල ආචාර්යවරුන් දක්වන ලද අදහස් උපුටා දක්වන සමහර ලිපි ද විය. මන්ත්‍රීවරියන්ගේ වැඩිවීමට ඉඩ සැලසීම නිසාවෙන් පළාත් පාලනය සඳහා යන වියදම් වැඩිවීම, ගමේ අවශ්‍යතා හඳුනාගැනීමට ... ඇති සුදුසු අපේක්ෂකයින් සිටීම වැනි කාරණා ඔවුහු පෙන්වා දුන්හ. වර්තමාන පිරිමි දේශපාලනඥයින් මෙම යෝග්‍යතාවය පිළිබඳව මෙම නිර්ණායකය සපුරාලන්නේ ද යන්න පිළිබඳව විමසන කිසිදු ප්‍රතිවිරුද්ධ මතයක් එවැනි ලිපිවල ඉදිරිපත් කර නොතිබුණි.

"කාන්තා නියෝජනය සඳහා මෙම අවශ්‍යතාව පැමිණියේ පළාත් පරිපාලකයින්ගෙන් හෝ කාන්තාවන්ගෙන් නොව කොළඹ කේන්ද්‍රීය සාකච්ඡා මගිනි. අවසාන ප්‍රතිඵලය වන්නේ ගම්වලින් තරඟ කිරීමට කාන්තාවන් සොයා ගැනීමට දේශපාලන පක්ෂවලට විශාල උත්සාහයක් දැරීමට සිදුවීමයි. එබැවින් එය කාන්තාවන්ගේ නියෝජනයට රුකුලක් වනු ඇතැයි හෝ ප්‍රජාතන්ත්‍රවාදයේ ඉදිරි පිම්මක් වනු ඇතැයි සිතීම මෝඩකමකි. "

*සිළුමිණ පුවත්පතේ හිටපු කර්තෘ චාමර ලක්ෂ්මන් කුමාර, සිළුමිණ, 2017 දෙසැම්බර්*

"විශේෂ විධිවිධාන ඉදිරිපත් කරනවා වෙනුවට සැමට ප්‍රයෝජනවත් වන මැතිවරණ ක්‍රමයක් සකස් කළ යුතුය. පවත්නා ක්‍රමය යටතේ කාන්තාවන්ට පමණක් නොව, අවංක පුද්ගලයින්ට පවා ජයග්‍රහණය කළ නොහැකිය. එම ක්‍රමය මගින් මැරයින්ට තැනක් ලබා දී ඇත. එබැවින් යහපත පිළිබිඹු වන පරිදි මැතිවරණ ක්‍රමය වෙනස් කළ හැකි නම් කාන්තා නියෝජනය ද ශක්තිමත් කළ හැකිය. අප යා යුත්තේ එතැනටය. එසේ නොවේ නම්, තේරී පත්වන කාන්තාවන් යනු වටිනාකමක් නැති පිරිමින් හා සම්බන්ධ වන අය මිස වෙනත් කාන්තාවන් නොවේ. එබැවින් එය කාන්තාවන්ට ප්‍රයෝජනවත් වේ යැයි මම විශ්වාස නොකරමි. "

*ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දේශපාලන විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ට කථිකාචාර්ය අනුරුද්ධ ප්‍රදීප් කරණසූරියගේ ලිපිය, 2017 දෙසැම්බර් මස ලංකාදීප*

2018 පෙබරවාරි මාසයේ පැවැත්වීමට නියමිත පළාත් පාලන මැතිවරණය සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ

සභාපති මහින්ද දේශප්‍රිය මහතා සමඟ කළ සම්මුඛ සාකච්ඡාවලට කෝටාව ක්‍රියාත්මක වන්නේ කෙසේද යන්න පිළිබඳ විස්තර මෙන්ම කෝටාව ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවන අවුල් සහගත තත්ත්වයන් වළක්වා ගත හැකි ආකාරය පිළිබඳ තොරතුරු ඇතුළත් විය. ඒ ඒ පළාත් පාලන ආයතනයට තෝරාගත යුතු සංඛ්‍යාවේ අවුල් සහගත නොවන බව සහතික කිරීම සඳහා, සෑම පළාත් පාලන ආයතනයක් සඳහාම නාමයෝජනා ලැයිස්තුවට ඇතුළත් කළ යුතු නිශ්චිත කාන්තා අපේක්ෂකයින් සංඛ්‍යාව මැතිවරණ කොමිෂන් සභාව විසින් නියම කර ඇති බව ද වාර්තා විය.[7] මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම්වලින් වාර්තා වූ තොරතුරු මගින් මැතිවරණ ක්‍රමයේ සිදුවන මූලික වෙනස්කම් පැහැදිලි කළේ ය. නව සංශෝධන මගින් තරුණ කෝටාව ඉවත් කර ඇති බවත්, දැන් තරුණයින්ට ද තරඟ කිරීමට ප්‍රමාණවත් ඉඩක් ලබා දීම දේශපාලන පක්ෂ විසින් සිදු කළයුතු බවත් වාර්තා විය.

"නීතියෙන් සෑම දෙයක්ම කළ නොහැක. අපි දැනටමත් කාන්තා නියෝජිතයින්ට සියයට 25 ක කෝටාවක් ලබා දී ඇති අතර නැවත තරුණයින් සඳහා තවත් සියයට 25 ක් ලබා දිය නොහැක. දේශපාලන පක්ෂවලට ද සමාජ වගකීම් ඇත. එබැවින් ඔවුන් පක්ෂ මට්ටමේ තරුණ තරුණියන් සඳහා කෝටාවක් වෙන් කළ යුතුය.

*ඇමති ෆයිසර් මුස්තාපා මහතා, ඩේලි නිවුස්, 2017 සැප්තැම්බර්* [8]

මැතිවරණ කොමිෂන් සභාව හෝ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම් උපුටා දක්වන පුවත් දෙමළ මාධ්‍යවල පළ නොකළ අතර බොහෝවිට දෙමළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ හෝ ඇමති ෆයිසර් මුස්තාපා මහතාගේ උපුටනයන් පළ කිරීමට උත්සුක විය.

අනෙකුත් පුවත්පත් හා සසඳන විට කෝටාව ක්‍රියාත්මක වන්නේ කෙසේද සහ එහි වැදගත්කම පිළිබඳව සිංහල පුවත්පත්වල ලිපි ගණනාවක් පළකර තිබුණි. ඉංග්‍රීසි පුවත්පත් ප්‍රධාන වශයෙන් ෆයිසර් මුස්තාපා මහතා සහ අනෙකුත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ප්‍රකාශ සහ ඔවුන් සමඟ කරන ලද සම්මුඛ සාකච්ඡා ආවරණය කළ අතර දෙමළ පුවත්පත් කෝටාවේ වැදගත්කම සහ වතු දෙමළ දේශපාලනයට එහි බලපෑම අවධාරණය කළේය. ශ්‍රී ලංකාවේ කාන්තා දේශපාලනයේ ඉතිහාසය මෙන්ම එවකට අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ, විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සමඟ කරන ලද සහ සම්මුඛ සාකච්ඡා හා ඔවුන්ගේ කතා ආවරණය කිරීමෙන් කෝටාවේ ප්‍රතිලාභ පිළිබඳව ලංකාදීප වැනි පුවත්පත්වල ගැඹුරු ආවරණයක් කර තිබුණි. පනත සම්මත කිරීම හෝ කෝටාවේ වැදගත්කම පිළිබඳව මහජන මතය ආවරණය නොවිය.

''එල්ටීටීඊ කාලය තුළ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සහ තර්ජන ගැන මා අසා නැත. නමුත් අපයෝජනය වැඩි වෙමින් පවතින අතර කාන්තාවකගේ දෘෂ්ටිකෝණයෙන් වෙනස්කම් සිදුකිරීම සඳහා දේශපාලනයට කාන්තාවන්ගේ සහභාගීත්වය අවශ්‍යයි "

*උතුරු පළාත් සභාවේ සාමාජික හා කාන්තා කටයුතු අමාත්‍ය ආනන්ති සසිදරන් මහත්මිය සමඟ සම්මුඛ සාකච්ඡාව, 2017 දෙසැම්බර් 1 වන දින තිනකරන්*

"අධ්‍යාපනය සඳහා ප්‍රවේශයත් සමග කාන්තාවන් සෑම අංශයකටම ඇතුළු වී ඇතත්, දේශපාලනයේ ඔවුන්ගේ නියෝජනය තවමත් ප්‍රමාණවත් නැහැ. රජයක් වෙනස් කිරීම සඳහා ඔවුන්ට ඡන්දය ප්‍රකාශ කළ හැකි වුවත්, පාර්ලිමේන්තුවේ ප්‍රමාණවත් තරම් කාන්තාවන් සංඛ්‍යාවක් නැහැ. මෙම තත්ත්වය වෙනස් කිරීමේ නියමු ව්‍යාපෘතියක් ලෙස, පළාත් පාලන ආයතනවල අවම කාන්තාවන් සංඛ්‍යාවක් ඇතුළත් කිරීමේ පනතක් සම්මත වෙලා තියෙනවා. සමහරු කියනවා ඔවුන්ට තරඟ කිරීමට කාන්තාවන් සොයා ගත නොහැකියි; එයට උදව් කළ නොහැකියි. යමෙක්ව සොයා ගත යුතුයි; ඒ අතර මැතිවරණයත් ජය ගත යුතුයි. නෝර්වීජියානු පාර්ලිමේන්තුවේ 50% ක් කාන්තාවන්; ඒ කිසිදු නීති සම්පාදනයකින් තොරවයි. සමහර යුරෝපීය කැබිනෙට්ටුවල අවම වශයෙන් 50% ක් හෝ බහුතරයක් කාන්තාවන්. එවැනි වෙනස්කම් නීතිය හා සමාජ මැදිහත්වීම් තුළින් සිදු කළ යුතුයි."

*විශාඛා විද්‍යාලයේ 100 වැනි සංවත්සරය අමතමින් හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා, 2017 සැප්තැම්බර් 10 වන දින දිනමිණ පුවත්පතින් උපුටා ගැනීම*

7 http://www.sundayobserver.lk/2017/12/10/news/female-candidates-minimum-number-mandatory
8 http://www.dailynews.lk/2017/09/25/features/129195/exclusion-youth-politics

**දෙවන අදියර**

**(2017 දෙසැම්බර් - 2018 පෙබරවාරි මැතිවරණ දිනය දක්වා)**

පළාත් පාලන මැතිවරණයට පෙර කරන ලද මැතිවරණ ප්‍රචාරණ කාලය තුළ දී, පුවත්පත් ආවරණය, විශේෂයෙන් ම ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළවූ පුවත්පත් අවධානය යොමුකර තිබුණේ මැතිවරණ ප්‍රචණ්ඩත්වය සහ මැතිවරණ ප්‍රචාරක කාලය තුළ කාන්තාවන් මුහුණ දුන් වෙනත් කාරණා, එනම් දේශපාලන පක්ෂවල සහාය නොමැතිකම වැනි කරුණු පිළිබඳවය. මෙයට මැතිවරණ නිරීක්ෂණ ආයතන වන නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරිත්වය මැතිවරණ ප්‍රචණ්ඩත්ව ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය සහ නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ජනතා ව්‍යාපාරය යන සංවිධාන විසින් කරන ලද සිදුවීම්, ප්‍රකාශ හා යාවත්කාලීන කිරීම් අඩංගු වාර්තා මෙන්ම කාන්තා ක්‍රියාකාරී ජාලය වැනි සිවිල් සමාජ කණ්ඩායම් විසින් කරන ලද විස්තරාත්මක විශ්ලේෂණයන් ද අන්තර්ගත විය. කාන්තා අපේක්ෂකයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ විමර්ශන සහ එවැනි ප්‍රචණ්ඩත්වයට එරෙහිව ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ අනතුරු ඇඟවීම් සහිත මැතිවරණ කොමිසම විසින් නිකුත් කරන ලද ප්‍රකාශ කිහිපයක් ද විය. මැතිවරණ කොමිසම විසින් නිකුත් කරන ලද ප්‍රකාශවල කාන්තාවන්ට එරෙහිව ප්‍රචණ්ඩත්වය පැවති ප්‍රදේශවල මැතිවරණ කල් දමන බවට කරන අනතුරු ඇඟවීම් ද ඇතුළත් විය. "ඡන්දය ප්‍රකාශ කිරීමේ නිදහස වළක්වන යම් බාධක පවතින්නේ නම්, එමම ප්‍රදේශවල මැතිවරණය කල් දැමීමට මැතිවරණ කොමිසම පසුබට නොවන්නේ' යයි දේශප්‍රිය මහතා පැවසීය. දිස්ත්‍රික් නිලධාරීන් ද එම ප්‍රදේශ පිළිබඳව සමීපව අධ්‍යයනය කරමින් සිටින අතර ඇතැම් ප්‍රදේශවල කාන්තා අපේක්ෂකයින් සඳහා අමතර ආරක්ෂාවක් අවශ්‍ය නම් මැතිවරණ ලේකම් කාර්යාලයට දැනුම් දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.",

*මහින්ද දේශප්‍රිය මහතා 2018 ජනවාරි 6 දින ඩේලි නිවුස් ලිපියක උපුටා දැක්වීමක්*

මැතිවරණ ප්‍රචාරණ සමයේ දී ප්‍රචණ්ඩත්වයට අමතරව අපේක්ෂිකාවන් මුහුණදුන් අභියෝග ද භාෂා තුනෙන්ම කර තිබූ මාධ්‍ය ආවරණය මගින් ඉස්මතු කර දැක්විය. කාන්තාවන්ට තරඟකිරීම දුෂ්කර කරන දඬුවමෙන් නිදහස්වීමේ සංස්කෘතියක් පැවැතීම, නාමයෝජනා ලබා ගැනීමේ සිට දේශපාලන පක්ෂවල සහයෝගය නොමැතිකම, අදාළ ලැයිස්තුවලට ඔවුන්ගේ නම් ඇතුළත් කර ගැනීමේ දුෂ්කරතාවය හා මුස්ලිම් ජාතික අපේක්ෂිකාවන් මුහුණ දෙන සුවිශේෂී ගැටළු ආදී ගැටළු පරාසයක් මෙම අභියෝගවලට අයත් වේ.

"අපරාධ චෝදනාවලට ලක්වූ හෝ රිමාන්ඩ් භාරයේ පසුවූ තරඟකාරියන් නොවීය. කෙසේ වෙතත්, ඔවුහු පුරුෂාධිපත්‍යය හේතුවෙන් දේශපාලනයට පිවිසීමේ අභියෝගයන්ට මුහුණ දෙති. තමන්ගේ ම ඡන්ද කොට්ඨාශයේ පිරිමි තරඟකරුවෝ මැතිවරණ ව්‍යාපාරය තුළ කාන්තාවන්ගේ නාමයට අපහාස කරති. ඒ නිසා කාන්තාවෝ එළියට ඇවිත් මැතිවරණ ව්‍යාපාරයේ නිරත වීමට බිය වෙති. "

*2018 ජනවාරි 14 වන දින තිනකරන් පුවත්පතෙහි පළ වූ ලිපිය*

"නීති විරෝධී ආයුධ සෙවීමේ මුවාවෙන් පොලිස් නිලධාරීන් පිරිසක් පසුගිය සතියේ ඇගේ නිවසට කඩා වැදුණෝය. ඇයගේ මැතිවරණ ප්‍රචාරණ පත්‍රිකා දුටු විට ඔවුහු ඇයගෙන් අපේක්ෂකත්වය ගැන විමසූහ. පොලිසිය පැවසුවේ නිවාස සෝදිසි කිරීම අවි ආයුධ පිළිබඳව සහ ව්‍යාජ මුදල් නෝට්ටු මුද්‍රණය කිරීම සම්බන්ධව පොලීසියේ 119 උපකාරක දුරකථන මාර්ගයට ලැබුණ නිර්නාමික ඇමතුමක් පදනම් කරගෙන බවය. නමුත්, ඒ වන විට මුළු ගමේම මිනිසුන් අපේ පාරේ රැස්ව සිටි නිසා පවුලට ලැජ්ජාවක් හා අපහසුතාවයක් ඇති වුණි. මා සහ මගේ පවුලේ සාමාජිකයින්ට මඩ ගැසීමට යමෙකු මෙය සැලසුම් කර ඇතැයි මම සැක කරමි," යනුවෙන් රිනූසා පැවසීය.

තම ප්‍රදේශයේ තවත් බොහෝ අපේක්ෂිකාවන් තරඟ කිරීමට තීරණය කළ විගස ආගමික නායකයින් ඇතුළු ප්‍රදේශයේ බලවත් පුරුෂයින්ගේ කෝපය උපයා ගත් බවද ඇය පැවසුවා ය.

විවිධ දේශපාලන පක්ෂ යටතේ තරඟ කරන පුත්තලමේ අපේක්ෂිකාවන් පවතින අවදානම් සැලකිල්ලට ගනිමින් කුඩා කණ්ඩායම් වශයෙන් ගෙයින් ගෙට ගොස් මැතිවරණ ප්‍රචාරණ කටයුතුවල නිරතවීමට තීරණය කර ඇත. "අපි හැමෝම කාන්තාව ලෙස හඳුන්වන පක්ෂයේ බව අපි ඔවුන්ට පැවසුවා. අපිට අපගේ නිවෙස්වල වාගේම පළාත් පාලන ආයතනවලදී ද හඬක් පැවතිය යුතුයි." රිනූසා පැවසුවාය.

2020 ජනවාරි 28 වන දින කාන්තා අපේක්ෂකයින් මුහුණ දෙන ප්‍රචණ්ඩත්වය සහ ගැටලු පිළිබඳව සන්ඩේ ටයිම්ස් පුවත්පතේ පළවූ ලිපියක පුත්තලම් කල්පිටිය ප්‍රදේශ සභාව සඳහා ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසයෙන් තරඟ වදින අපේක්ෂිකාවක් වන කාදර් ඉබ්‍රාහිම් රිනූසා මහත්මියගේ උපුටා දැක්වීමක්.[9]

වාර්තාකරණය ප්‍රධාන වශයෙන් මැතිවරණ නිරීක්ෂණ ආයතන මෙන්ම සිවිල් සමාජ කණ්ඩායම් විසින් කරන ලද ප්‍රකාශ සහ මාධ්‍ය යාවත්කාලීන කිරීම් මගින් මෙහෙයවා තිබෙනු දක්නට ලැබුණි. ඔවුහු අපේක්ෂිකාවන් මුහුණදුන් අභියෝග ඉස්මතු කිරීම සඳහා නිශ්චිත ක්ෂේත්‍රවල අභියෝග සහ ගැටළු පිළිබඳ උදාහරණ සැපයූහ. නිදසුනක් වශයෙන්, 2018 ජනවාරි මාසයේ සන්ඩේ ටයිම්ස් පුවත්පතේ පළ වූ කාන්තා ක්‍රියාකාරී ජාලය විසින් අන්තර්ජාලය හරහා අපේක්ෂිකාවන්ට එරෙහිව වෛරී ප්‍රකාශ කිරීම, බොහෝ අපේක්ෂිකාවන් මුහුණ දෙන චරිත ඝාතනය සහ මඩුලච්චරුන් නිසාවෙන් මුස්ලිම් අපේක්ෂිකාවන් මුහුණ දෙන විශේෂිත ගැටළු සම්බන්ධයෙන් පොලීසිය සහ මැතිවරණ කොමිසම වැනි ආයතන මෙන්ම දේශපාලන පක්ෂ ද නිහඬ පිළිවෙතක් අනුගමනය කිරීම පෙන්වා දී තිබුණේය.

"මේ දක්වා මෙම අපේක්ෂිකාවන් අයත්වන කිසිදු දේශපාලන පක්ෂයක්, නීතිය ආරක්ෂා කිරීමට වගකිව යුතු පොලීසිය, මැතිවරණ කොමිසම හෝ කිසිදු දේශපාලන පක්ෂ නායකයෙක් අපේක්ෂිකාවන්ට එරෙහිව ප්‍රසිද්ධියේ විවෘතව පිළිකුල් සහගත අයුරින් වෛරී ප්‍රකාශ කිරීම හෝ ආගමික හා දේශපාලන පසුබිමක් ඇති පිරිමින්ගේ වාචික හා මානසික ප්‍රචණ්ඩත්වය හෙළා දැක නැති වීම වේදනාකාරී හා ගැටළු සහගත කරුණක් බව කාන්තා ක්‍රියාකාරී ජාලය නිරීක්ෂණය කළේය. "ඔවුන්ගේ නිශ්ශබ්දතාවය කාන්තාවන් දේශපාලනයට සහභාගී වීම සැබවින්ම පිළිගන්නේද නැතහොත් හුදෙක් විධිමත් ක්‍රියාවක්ද යනුවෙන් එක් ප්‍රශ්නයක් මතු කරයි." කාන් තාවන් සියුම්, නිහඬ හා සහ සැඟවුණු ප්‍රචණ්ඩත්වයන්ට දිගටම ගොදුරු වන බව සඳහන් කරන කාන්තා සංවිධාන සන්ධානය මෙම ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් ඔවුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝණය කරන අතර මැතිවරණයේ විශ්වසනීයත්වයට ඍණාත්මක ලෙස බලපෑම් කරන බව සනිටුහන් කරයි. "

*සන්ඩේ ටයිම්ස්හි පළවූ කාන්තා ක්‍රියාකාරී ජාලයේ ප්‍රකාශය*

"මෙම මැතිවරණයේදී, කාන්තාවන්ට බොහෝ අභියෝගවලට මුහුණ දීමට සිදුවී තිබේ. මීට පෙර සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ, දේශපාලන පක්ෂ විසින් අපේක්ෂිකාවන්ගේ නම් නාමයෝජනා ලැයිස්තුවට ඇතුළත් කළ යුතු විය. ඒ අනුව කාන්තාවන්ගේ නම් නාමයෝජනා ලයිස්තුවේ අවසානයට එකතු කිරීම පුරුද්ද විය. නමුත් මෙවර 25% කෝටාව සහ 10%ක් කාන්තාවන් අනිවාර්යයෙන් ඇතුළත් කිරීම කළ යුතු නිසාවෙන් කාන්තාවන්ට ඉතා වැදගත් ස්ථානයක් ලැබී තිබේ. මේ හේතුවෙන් කාන්තාවන්ට විවිධ අභියෝගවලට මුහුණ දීමට සිදුවේ. තමන්ගේ ඡන්ද කොට්ඨාශයේ ඡන්දදායකයින් හොඳින් දන්නා සමහර කාන්තාවන් වෙනත් ඡන්ද කොට්ඨාශවල නාමයෝජනා පත්‍රවලට ඇතුළත් කර ඇත. ක්‍රියාශීලී හා දීප්තිමත් කාන්තාවන්ගේ නම් ලැයිස්තුවෙන් තවත් පහළට තල්ලු කර ඇත. ලයිස්තුවේ ඉහළින් ම ඇත්තේ පක්ෂ සංවිධායකයින් දන්නා හෝ ඔවුන් හා සම්බන්ධ කාන්තාවන්ගේ නමිය. කෝටා ක්‍රමය ආරක්ෂා කිරීම සඳහා මෙම අභියෝග ජය ගැනීමට අප මහන්සි වී කටයුතු කළ යුතුය. සමහර ප්‍රදේශවල කාන්තාවන්ට ගැටලු තිබේ. සමහර අවස්ථාවල දී මැතිවරණ ප්‍රචාරණ කටයුතු වල නිරතවූවන්ට ආහාර පිසීමට සහ රාත්‍රියේ මත්පැන් සැපයීමට කාන්තාවන් යොදා ගෙන තිබේ. පෝස්ටර් මුද්‍රණය කිරීමට මුදල් නොමැති සමහර අය සිටිති. එබැවින් මෙම කෝටා ක්‍රමය සාර්ථක කර ගැනීම සඳහා මෙම අභියෝග ජය ගැනීමට අප කටයුතු කළ යුතුය. පිරිමි සංවිධායකයින් සමඟ කාන්තා සංවිධායකයින් ද පත් කළ යුතු යැයි අපි නිර්දේශ කරමු. "

*කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය විසින් සංවිධානය කරන ලද මාධ්‍ය හමුවක දී ස්ත්‍රී සම්පත් මධ්‍යස්ථානයේ විධායක අධ්‍යක්ෂිකා සුමිකා පෙරේරා මහත්මියගේ උපුටනයක් - 2018 ජනවාරි 27 වන දින දිනමිණ*

පුවත්පත් සාකච්ඡා හෝ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩා යම් විසින් කරන ලද ප්‍රකාශ පදනම් කරගත් සමහර වාර්තා ප්‍රචණ්ඩත්වය ගැන පමණක් ම වූ වාර්තා නොවේ. උදාහරණයක් ලෙස සිංහල පුවත්පත්වල: සමහරෙක් තම පක්ෂ අපේක්ෂිකාවන්ට ඡන්දය නොදෙන ලෙස ජනතාව වෙතට ගොස් පවසන බවට, සමහර දේශපාලනඥයින් ඔවුනගේ අපේක්ෂිකාවන්ට සහ ඔවුන්ගේ මැතිවරණ ප්‍රචාරණ කටයුතුවලට පූර්ණ සහයෝගය නොදක්වන බවට

*9 http://www.sundaytimes.lk/180128/news/intimidation-insults-attempt-to-deter-women-poll-candidates-278866.html*

වූ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේ වාර්තා උපුටා දැක් වූ මාධ්‍ය ආවරණයන් ද විය. මඩ ගැසීම සහ පිරිමි සගයන්ගේ සහයෝගය නොමැතිකම පිළිබඳව යම් පුවත්පත් ආවරණයක් ද විය.

මෙම කාල පරිච්ඡේය තුළ භාෂා තුනෙන් ම කෝටාවේ වැදගත්කම මෙන්ම කෝටා ක්‍රමය ක්‍රියාත්මක වන්නේ කෙසේද යන්න ගැනත්, නාමයෝජනා කාලය සහ සමස්ත 25% සෑදී ඇති ආකාරය පිළිබඳවත් පැහැදිලි කරන බොහෝ ලිපි පළකර තිබුණි. ලිපි හා සම්මුඛ සාකච්ඡා කෝටාවේ ඇති ධනාත්මක පැති කිහිපයක් සාකච්ඡා කළේය. කෝටාව ග්‍රාමීය හා නාගරික කාන්තාවන්ට වඩාත් ක්‍රියාකාරි දේශපාලනයට හා දේශපාලන ජීවිතයකට පිවිසීමට හැකියාව ඇති කරනු ලැබේ. දොරටු පාලකයන් ලෙස කටයුතු කරන දේශපාලන පක්ෂවල සංස්කෘතිය වෙනස් වනු ඇති බවත්, පාලනයට තේරී පත් වන කාන්තාවන් විසින් ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී වන ප්‍රතිපත්ති සම්පාදනය හඳුන්වා දෙනු ඇති බවත් මෙම ලිපිවල සඳහන් කර තිබුණි. අපේක්ෂිකාවන් අතර කාන්තා කෝටාව අත්පත් කර ගැනීම සඳහා කටයුතු කළ ශූරියක් සමඟ කරන ලද සම්මුඛ සාකච්ඡා සම්බන්ධයෙන් ගත් විට, කොළඹ නගරාධිපති රෝසි සේනානායක මහත්මිය කැපී පෙනෙන චරිතයක් ලෙස කරන ලද සම්මුඛ සාකච්ඡා හෝ ප්‍රකාශ කිහිපයක් පුවත්පත් වාර්තාකරණයේ අන්තර්ගත කර තිබුණි.

"වැඩි වැඩියෙන් කාන්තාවන් දේශපාලනයට එක්වන බව සහතික කරන අතරම, ඊළඟ පියවර විය යුත්තේ පාර්ලිමේන්තු ආසන සඳහා කෝටාවක්ය. පාර්ලිමේන්තු ක්‍රමයේ දී, මම තරයේ විශ්වාස කරන්නේ කාන්තාවන්ට ඔවුන්ගේ නිසි ප්‍රවේශය අහිමි කරන්නේ මනාප ඡන්ද ක්‍රමයයි. මැතිවරණයක් සඳහා අති විශාල මුදලක් අවශ්‍යයි. දේශපාලනයට පිවිසීමට කැමති බොහෝ කාන්තාවන් ආයුධ සන්නද්ධ සංස්කෘතිය සහ චරිත ඝාතනය හරහා යා යුතු බැවින් අධෛර්යමත් වේ. මට නම්, 25% ප්‍රමාණවත් නැහැ. ඉදිරියට යා හැකි එකම මාර්ගය නම් වෙනසක් ඇති කිරීම අරමුණු කරගත් ප්‍රතිපත්ති හා භාවිතය සහතික කිරීමේ ක්‍රියාවලියයි. මේ තමයි අවම අවශ්‍යතාවය විය යුත්තේ, නමුත් ඊටත් වඩා වැඩිනම් හොඳයි. අප එය අනිවාර්ය කර මේ රටේ මැතිවරණ ක්‍රම සම්බන්ධයෙන් වෙනසක් ඇති කිරීම අරමුණු කරගත් ප්‍රතිපත්ති හා භාවිතය සහතික කිරීමේ ක්‍රියාමාර්ග ගත යුතු යි. කාන්තා ව්‍යාපාරය ශක්තිමත් විය යුතුයි. මේ වෙනුවෙන් පෙනී සිටිය යුතු යි. ",

*රෝසි සේනානායක මහත්මිය, ඩේලි මිරර් පුවත්පත සමඟ සම්මුඛ සාකච්ඡාව, 2018 ජනවාරි 16*

කාන්තාවන්ගේ නියෝජනය සහ කෝටාවේ වැදගත්කම පිළිබඳව පුරවැසියන් සමඟ කළ සම්මුඛ සාකච්ඡාවලින් පෙන්නුම් කළේ පළාත් පාලන ආයතනවලට තේරී පත්වන කාන්තාවන්ගෙන් ඉහළ බලාපොරොත්තු තිබුණ බවත්, කාන්තාවන් ප්‍රතිපත්ති සම්පාදනයට කටයුතු කිරීමෙන් ජයග්‍රහණය ලබා ගත හැකිය යන්නත්, කාන්තාවන්ට පමණක් සංවේදී විය හැකි යම් යම් ගැටළු හෝ අංශ ඇති බැවින් ඒවා ක්‍රියාත්මක කිරීමට හැකිය යන විශ්වාසයයි.

"කාන්තාවන් සඳහා කෝටාවක් වෙන් කිරීමේ පියවර සාදරයෙන් පිළිගනිමින් දේශපාලනයේ කාන්තාවන් සිටීම අනෙක් කාන්තාවන්ට ඉදිරියට පැමිණ ඔවුන් මුහුණ දෙන විවිධ ගැටලු ගැන කතා කිරීමට පහසුකම් සපයන බව රාජනි පැවසුවා ය. "පිරිමින්ට නොතේරෙන බැවින් පිරිමින් සමඟ සාකච්ඡා කිරීමට අකමැති හෝ පිරිමින්ට නොතේරෙන දේවල් කාන්තාවන්ට තිබේ." යනුවෙන් ඇය එක් කළා ය. මඩකලපුව හින්දු විද්‍යාලයේ අධ්‍යාපනය ලැබූ ඇයගේ දේශපාලනය පිළිබඳ දැනුම පෙළ පොත් පදනම් කර ගෙන උසස් පෙළ විභාගය සඳහා දේශපාලන විද්‍යාව හැදෑරීම පමණක් ම විය. නමුත් සමාජ සේවිකාවක් ලෙස වසර ගණනාවක් වැඩ කිරීම තුළින් ලැබූ පරිචය දේශපාලනයේ වඩාත් ක්‍රියාකාරී භූමිකාවක් රඟ දැක්වීමට අවශ්‍ය කුසලතාවන් ඔපමට්ටම් කර ඇත. ශක්තිමත් කාන්තා නියෝජනයක් අවශ්‍යයි කියල මට පෙනෙනවා. වසර 30 ක යුද්ධය අපව ශක්තිමත් කර තිබෙනවා. දේශපාලන ක්ෂේත්‍රය තුළ අරගල කිරීමට ඇති අභියෝග යන්ට අපට මුහුණ දිය හැකියි. වඩා හොඳ වීදි ආලෝකකරණයක්, කාර්යක්ෂම ජලාප්‍රවාහන පද්ධතියක්, ළමා සායන සහ උද්‍යාන හෝ සුසාන භූමි වැඩි දියුණු කිරීම යන සියල්ලම පළාත් පාලන ආයතනවල විෂය පථයට අයත් වේ" යනුවෙන් ඇය ප්‍රකාශ කළාය. ශ්‍රී ලංකා දෙමළ පක්ෂයේ මඩකළපුවේ අපේක්ෂිකා ලක්ෂ්මි රාජනි ජේප්‍රකාශ් මහත්මිය සමග පැවැත් වූ සම්මුඛ සාකච්ඡාව, *සන්ඩේ ටයිම්ස් 2018 ජනවාරි 14*[10]

කාන්තා අපේක්ෂකයින්ගේ "යෝග්‍යතාවය" ගැන බොහෝ

10 http://www.sundaytimes.lk/180114/news/people-gutted-by-war-drought-speak-out-277078.html

සාකච්ඡා පැවතී අතර දේශපාලඥයෙකුගේ මවක්, සහෝදරියක් හෝ බිරිඳක් ලෙස නොව සුදුසුකම් ලබා දේශපාලනයට අඩිය තැබිය යුතු බවත් සාකච්ඡාවට භාජනය වීම සිත්ගන්නා කරුණක්. මෙය අමාත්‍ය ෆයිසර් මුස්තාපා මහතා විසින් සමහර ප්‍රකාශ සහ කථා වලදී අවධාරණය කරන ලද කරුණක් ද විය. 2017 දෙසැම්බර් මාසයේ දී සිළුමිණ පුවත්පතේ හිටපු කර්තෘ චාමර ලක්ෂ්මන් කුමාර අදහස් පළ කරන ලිපියක සඳහන් කර තිබුණේ කෝටාව ක්‍රියාත්මක නොවන බවය. මෙයට උදාහරණ වශයෙන් පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරියන් 13 දෙනාගේ අකාර්යක්ෂමතාවය පෙන්වාදුන් අතර ඔවුහු "කෑමට සහ ඇණුම් ඇරීම සඳහා පමණක් තම කට ඇරිය" බවත් සමහරු අවුරුදු පහ තුළ පාර්ලිමේන්තුවේදී කට නොඇරිය බවත් සටහන් කළේය. කෝටාව සහ කාන්තා දේශපාලනඥයන් පිළිබඳ බොහෝ කතිකාවන්හි එවැනි කාන්තා විරෝධී අගතිගාමී අදහස් දැක්වීම් සොයා ගත හැකි වුවද, පිරිමින් එම ප්‍රමිතීන්ට අනුකූලද යන්න පිළිබඳ ප්‍රශ්න කිරීම, මේ දක්වා පිරිමි දේශපාලනඥයින්ගේ කාර්යක්ෂමතාව වැනි මෙයට ප්‍රතිවිරුද්ධ අදහස් දක්වන ආඛ්‍යාන වාර්තා කිරීම් බරපතල ලෙස මුද්‍රිත මාධ්‍ය තුළ නොපැවතුණි.

මැතිවරණයට ඉදිරිපත් වූ අපේක්ෂිකාවන් පිළිබඳව සිංහල හා දෙමළ මාධ්‍ය තුළ මැතිවරණයට පෙර විශාල ආවරණයක් තිබුණි. මෙම මාධ්‍ය ආවරණයට සමහර අපේක්ෂිකාවන් පිළිබඳ විස්තර සහ ඔවුන් තරඟ කිරීමට හේතුව, ඔවුන්ව තෝරාගතහොත් ඔවුන් දියත් කිරීමට සැළසුම් කර ඇති කටයුතු ආදිය පිළිබඳව අදහස් දක්වන සම්මුඛ සාකච්ඡා හෝ විශේෂාංග ඇතුළත් විය. මෙවැනි ආකාර වූ ආවරණයක් ඉංග්‍රීසි පුවත්පත්වල දක්නට නොලැබුණි. මෙම ලිපි වෙනත් රටවල් හා සංසන්දනාත්මකව ශ්‍රී ලංකාවේ පාලන ව්‍යුහය තුළ කාන්තා නියෝජනය, ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ දේශපාලන ඉතිහාසය සහ ශ්‍රී ලංකාවට කෝටාවේ ඇති වැදගත්කම පිළිබඳව සාකච්ඡා කර තිබුණි. දිනමිණ වැනි සිංහල මාධ්‍ය පුවත්පත් කෝටාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල ආචාර්යවරුන් සහ සිවිල් සමාජය සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීය.

"මම තරඟ කරන්නේ මම ජනගහනයෙන් 53%න් කෙනෙක් වන නිසා පමණක් නොව, පවත්නා ක්‍රමයට අභියෝග කිරීමට සහ නව දේශපාලන සම්ප්‍රදායේ කොටසක් වීමටත්ය. කාන්තාවන් පිරිමින්ට වඩා අඩුවෙන් දූෂිතයි යන්න ඔප්පු කරන ලද සත්‍යයකි. මා තරඟ කරන්නේ නව දේශපාලන සම්ප්‍රදායට මාර්ග ඇති බව පෙන්වීමටයි. මෙම අපිරිසිදු දේශපාලන ක්‍රමය වෙනස් කිරීම අප ගමෙන් ගමට ආරම්භ කළ යුතුයි."

*කෑගල්ල මහ නගර සභාව සඳහා තරඟ කළ එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂිකා ඩිස්නා රංජනි මහරාච්චි මහත්මිය සමග කරන ලද සම්මුඛ සාකච්ඡාව දිනමිණ, 2018 පෙබරවාරි 5*

"දරාගත නොහැකි ජීවන වියදම, දූෂණය සහ අපද්‍රව්‍ය අඩු කිරීමට මම කටයුතු කරමි. නව ආදායම් උත්පාදනය කිරීමේ වැඩසටහන් යෝජනා කරමි."

*කුලියාපිටිය මහ නගර සභාව සඳහා තරඟ කළ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ අපේක්ෂිකා නන්දා වික්‍රමනායක මහත්මිය සමග කරන ලද සම්මුඛ සාකච්ඡාව දිනමිණ, 2018 ජනවාරි 25*

"මුස්ලිම් කාන්තාවක් වශයෙන්, මගේ ස්වාමිපුරුෂයාට සහ මගේ දෙමාපියන්ගේ පවුලේ අයට මම තරඟ කරන්නේ ඇයිද යන්න ඒත්තු ගැන්වීමට මට සිදුවිය. අනෙක් මුස්ලිම් කාන්තාවන්ට ආදර්ශයක් වීමට මට අවශ්‍යයි. කාන්තාවන්ට වෙනසක් කළ හැකි බව ඔවුන්ට දන්වන්නත් මට අවශ්‍යයි. කාන්තාවන් ඉදිරියට පැමිණ ප්‍රසිද්ධ ජීවිතයට පිවිසිය යුතුයි. ඒ මන්දයත් කාන්තාවන්ට තමන් මුහුණ දෙන ගැටලු පිළිබඳව වෙනත් කාන්තාවන් සමග නිදහසේ කතා කළ හැකි බැවිනි."

*කාත්තාන්කුඩි නගර සභාව සඳහා තරඟ කළ මුස්ලිම් ජාතික සන්ධානයේ (එම්එන්ඒ) අපේක්ෂිකා ඒ.ජී.එස්. නලීමා මහත්මිය, සන්ඩේ ටයිම්ස් 2018 ජනවාරි 14*

දෙමළ මාධ්‍ය පුවත්පත් විශේෂයෙන් ම තේ වතු ක්ෂේත්‍රයේ කාන්තාවන් මැතිවරණයට ඉදිරිපත් වීමේ වැදගත්කම අවධාරණය කළ අතර දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීමට සහ වැවිලි අංශය නියෝජනය කිරීම සඳහා තරඟ කිරීමට ඔවුන්ව දිරිමත් කරන ලදී. සමහර සම්මුඛ සාකච්ඡා සහ විශේෂාංගවලින් කෝටා පමණක් වතු ක්ෂේත්‍රයෙන් තරඟ කිරීමට කාන්තාවන්ට උදව් නොවන බව පෙන්වා දී තිබුණි. ඒ, ඔවුන් ජීවත් වන පිතෘමූලික සමාජය කිසි විටෙකත් ඔවුන්ට දේශපාලනික වශයෙන් පමණක් නොව නායකත්ව තනතුරු ද ලබා දී නොමැති නිසාවෙනි. එම නිසා දේශපාලන පක්ෂවලට නායකත්ව සංවර්ධනය සඳහා ආයෝජනය කිරීමට සිදුවනු ඇත.

" පුරුෂාධිපත්‍ය ක්‍රමය මගින් වතුකරයේ කාන්තා නායකත්වය ප්‍රතික්ෂේප කිරීම නිසාවෙන් මෙම 25% කෝටා ක්‍රමය අපි අගය

කරනවා. ප්‍රධාන ධාරාවේ දේශපාලනයට අවතීර්ණ වී සංවර්ධනය ළඟා කර ගැනීමට ඔවුන්ට මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගත හැකිය. ”

*තිනකරන්, සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂ පී. මුතුලිංගම් මහතා සමඟ සම්මුඛ සාකච්ඡාව 2017 දෙසැම්බර් 10*

කෝවිල් භාරකරුවන්, පාසල් සංවර්ධන සමිති හෝ සමුපකාර සමිති පවා සමාජයට නායකත්වය දීමට වැවිලි අංශය කිසි විටෙකත් කාන්තාවන්ට අවස්ථාව ලබා දී නොමැත. එසේනම් ඔවුන් ඔවුන්ගේ නායකත්වය වැඩි දියුණු කරන්නේ කෙසේද? තීරණ ගැනීමේ හැකියාව නායකත්වය නොමැතිව ගොඩනැගීමට නොහැකි වනු ඇත. එබැවින්, කාන්තා නියෝජනය ගැන කතා කිරීමට අපට අවශ්‍ය නම්, පළමුව අපට ඔවුන්ගේ නායකත්ව කුසලතා ගොඩනැංවිය යුතුය. එසේ නොවුවහොත් එය දේශපාලනයේ කාන්තාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා දේශපාලන කාලය තුළ පමණක් කරන කතාවක් වනු ඇත. ”

*තිනකරන් විශේෂාංග ලිපිය, 2017 දෙසැම්බර්*

"අපි මුල්ලිවයික්කාල්හි සිටින විට කිසිවෙකු අප වෙනුවෙන් හඬක් නැගුවේ නැත. අවසානයේ කිසිවෙකු අප සමඟ සිටියේ නැත. අපගේ අපේක්ෂිකාවන්ගේ ප්‍රමුඛතාවය දෙමළ ප්‍රජාවට සාධාරණත්වය ඉටුකර දීමයි. අපගේ සහයෝගිතාවය පෙන්වීම සඳහා නිසි අපේක්ෂකයින් තෝරා ගත යුතුය. ",

*අපේක්ෂිකා එස්. ලලිතකුමාරි මහත්මිය, 2018 ජනවාරි 26 වන දින තිනකරන්හි මුල් පිටුවේ ප්‍රවෘත්ති වාර්තාවකින්*

**තුන්වන අදියර (මැතිවරණයට පසු මාධ්‍ය ආවරණය)**

සමහර ලිපි/වාර්තාවලින් මැතිවරණය අවසන් වීමෙන් පසු කරන ලද මාධ්‍ය ආවරණය අපේක්ෂිකාවන් මුහුණ දෙන ගැටළු පිළිබඳව දිගින් දිගටම සාකච්ඡා කරන ලදී. මැතිවරණ දිනය දක්වාම දේශපාලන පක්ෂ විසින් ඔවුන්ව රවටා ඇති ආකාරය, මැතිවරණයට ඉදිරිපත් වීමට හෝ කොට්ඨාශය ජයග්‍රහණය කිරීමට නොහැකි වීම හෝ හොඳ බිම් මට්ටමේ අත්දැකීම් ඇති කාන්තාවන් අතිරේක ලැයිස්තුවට ඇතුළත් කර තිබීමේ ප්‍රතිඵලයක් ලෙස ආසනයක් නොලැබීම ඒ අතර විය. සමහර පක්ෂ විසින් කෝටාව අනිසි ලෙස භාවිතා කළ ආකාරය හා ආසන වෙන් කරන ආකාරය වැඩිදියුණු කළ යුතු ආකාරය පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා කාන්තා අයිතිවාසිකම් සංවිධාන විසින් කරන ලද මාධ්‍ය සාකච්ඡා පිළිබඳව තොරතුරු ද සමහර මාධ්‍ය ආවරණ අතර තිබුණි.

"මොණරාගල සාර්ථක ව්‍යාපාරයක් පවත්වාගෙන යන ව්‍යවසායිකාවක වන සෝමා දිසානායක ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් පෙනී සිටි අතර ප්‍රදේශයේ මහජන සහයෝගය තිබියදීත් ඇයව අතිරේක ලැයිස්තුවට ඇතුළත් කර තිබුණි.

පුත්තලමේ දී, ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසය බිස්ලියා භූතෝට (31) අවසාන මොහොතේ දී පුත්තලම් ප්‍රදේශීය සභාව සඳහා ඉදිරිපත් වන ලෙස එකඟතාවයක් ඇති කර ගත්තේය. නමුත් පක්ෂය ඇයව නම් කර තිබුණේ පක්ෂයට එතරම් සහයෝගයක් නැති ප්‍රදේශයකටය. " ජනතාව තමන්ගේ පක්ෂයෙන් තරඟ වදින කාන්තාවන්ට ඡන්දය නොදෙනු ඇතැයි සිතා අපේම පක්ෂයේ සමහර පිරිමි ප්‍රදේශයේ විරුද්ධ පක්ෂයට පක්ෂව මැතිවරණ ව්‍යාපාරයේ යෙදුනා." යනුවෙන් භූතෝ පැහැදිලි කළා ය.

එපමණක් නොව, වර්තමාන අර්බුදයේ දී, ඇගේ පිරිමි සගයන් බොහෝ දෙනෙක් ඉල්ලා ඇත්තේ පක්ෂය විසින් කාන්තාවන්ට අමතර ආසන ලබා නොදෙන ලෙසය. සමහරු තම සභාවට කාන්තාවන් පත් කළහොත් ඉල්ලා අස්වන බවට ද තර්ජනය කර තිබුණි.

"මගේ කල්පිටියේ සිට පුත්තලම් දක්වා පක්ෂය සඳහා මැතිවරණ ව්‍යාපාරයේ නිරත වන විට ඇය ගැබ්ගෙන සිටියාය. මැතිවරණ ව්‍යාපාරය සඳහා අපට ඔහුගේ වෑන් රථය ලබා දුන් ආසන සංවිධායකවරයා දේශපාලනය කාන්තාවකට සුදුසු තැනක් නොවන බවත් අප ආසනයක් නොඉල්ලිය යුතු බව පවසන බව, ඇය පැවසුවාය.

*ක්‍රියාධරයින් සහ අපේක්ෂිකාවන් කිහිප දෙනෙකු සමඟ ඔවුන්ගේ මැතිවරණ සහ පශ්චාත් මැතිවරණ අත්දැකීම් පිළිබඳ ඩේලි නිවුස් ලිපිය, 2018 මාර්තු 1*

කෙසේ වෙතත්, පශ්චාත් මැතිවරණ ආවරණයෙන් වැඩි ප්‍රමාණයක් කෝටාව ක්‍රියාත්මක කිරීමේ දුෂ්කරතාවය පිළිබඳව අවධානය යොමු කර තිබුණි. සමහර සභාවලට 25% කාන්තා අවශ්‍යතා සපුරාලීමට නොහැකි වූ අතර පනතට අනුව පවා අවශ්‍ය සංඛ්‍යා සම්පාදනය කිරීමට නොහැකි විය. එම නිසා සභාව පිහිටුවීම ඉදිරියට ගෙන යාමට නොහැකි විය. "පළාත් පාලන ආයතන මැතිවරණ පනතේ ඇති හිඩැසක් නිසා" අවම වශයෙන් පළාත් පාලන ආයතන දහයකවත් 25% කාන්තා නියෝජනය පවත්වා ගත

නොහැකි බව මැතිවරණ කොමසාරිස් මහින්ද දේශප්‍රිය ප්‍රකාශ කළේය. නාගරික හා ප්‍රදේශීය මට්ටමින් පළාත් පාලන ආයතන 340 ක් තරඟ වැදුණි. මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා සමඟ කළ ප්‍රකාශ හා සම්මුඛ සාකච්ඡාවලදී මෙම ව්‍යාකූලත්වයට හේතු ලෙස ලැයිස්තු දෙකේ ක්‍රමවේදය දෝෂාරෝපණයට භාජනය විය. නව මැතිවරණ ක්‍රමයේ පවතින ප්‍රායෝගික ගැටළු හේතුවෙන් 25% ක්‍රියාත්මක කළ නොහැකි බව වෙනත් සම්මුඛ සාකච්ඡාවලදී ඔහු ප්‍රකාශ කළේය. මෙම ප්‍රකාශයන්ට යම් තල්ලුවක් ද ලැබුණි. උදාහරණයක් ලෙස නගරාධිපති රෝසි සේනානායක මහත්මිය මාධ්‍ය වෙත නිකුත් කළ නිවේදනයක මෙසේ සඳහන් විය. " සියයට 25 ක් වන අවම කාන්තා සභා සාමාජිකත්වය ක්‍රියාත්මක කළ නොහැකි බව පැවසීම අපකීර්තියක් හා අයහපත් විශ්වාසයක්". ඇය මැතිවරණ කොමිෂන් සභාව හෝ දේශපාලන පක්ෂ මෙම නීතිය පිළිපැදීම " අසාධාරණ" හෝ "බරක්" ලෙස නොසැලකිය යුතු බව තවදුරටත් කියා සිටියාය.සමහර පක්ෂවලට දැන් ඔවුන් බලාපොරොත්තු වූවාට වඩා වැඩි කාන්තාවන් සංඛ්‍යාවක් ඔවුන්ගේ ලැයිස්තුවෙන් නම් කළ යුතු නිසා නීතිය පසෙකට දැමිය නොහැක. නීතියේ පැහැදිලි අභිප්‍රාය පරාජය කළ නොහැකි" යයි ඇය ප්‍රකාශ කළාය. නීතිය නොසලකා හැරීම කාන්තාව වෙනස් කොට සැලකීම පමණක් නොව, ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලිය සහ ඡන්දදායකයින්ගේ අපේක්ෂාවන් මග හැරීමක් ද වේ.

කාලය ගෙවී යත්ම, මාධ්‍ය ආවරණය කෝටාවේ අනාගතය වටා භ්‍රමණය විය. මීළඟ මැතිවරණය සඳහා කෝටාව ක්‍රියාත්මක කිරීමට පෙර මෙම මැතිවරණයෙන් පාඩම් ඉගෙන ගත යුතු බව සමහර සාකච්ඡාවල සඳහන් විය. එම ලිපි නීතියේ පැහැදිලිතාවයක් ඇතිකිරීම සඳහා නීතිය සංශෝධනය කළ යුතු බව පෙන්වා දී තිබුණි. පළාත් පාලන හා පළාත් සභා ඇමති මුස්තාපා මහතා විසින් කාන්තාවන් සඳහා වන 25% කෝටාව අඩු කිරීමට තමන් හිස නොනමන බව ප්‍රකාශ කළේය. මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති මහින්ද දේශප්‍රිය මහතා මෙම නීතිමය වංචාවන් පිළිබඳව මුල සිටම නීතිපතිවරයාට අනතුරු ඇඟවූ බව ප්‍රකාශ කළේය. පළාත්පාලන හා පළාත් සභා ඇමති මුස්තාපා මහතා සහ කොළඹ නගරසභාවේ නගරාධිපති රෝසි සේනානායක මහත්මිය වැනි ප්‍රධාන පුද්ගලයින් කෝටාවට සහය පළ කරමින් මැතිවරණයට පසු සති කීපය තුළ ප්‍රකාශ නිකුත් කරන ලදී.

"මෙම ප්‍රතිපාදනය පිටුපස ඇති ගාමක බලවේගයක් ලෙස, කාන්තාවන්ගේ අවම නියෝජනය පිළිබඳ නීතිය පැහැදිලිව පවතින බව මට නිසැකවම පැවසිය හැකිය. සංශෝධිත පනතේ 27 එෆ් වගන්තිය යටතේ "සෑම පළාත් පාලන ආයතනයකම සිටින මුළු සාමාජික සංඛ්‍යාවෙන් සියයට විසිපහකට නොඅඩු සංඛ්‍යාවක් කාන්තා සාමාජිකාවන් සිටිය යුතුය" මෙම කොටස ඉතා පැහැදිලියි සහ සරල යි. අරථ නිරූපණයට විවෘත නැත." නගරාධිපතිනි රෝසි සේනානායක මහත්මිය මාධ්‍ය වෙත නිකුත් කළ මාධ්‍ය නිවේදනයක දැක්වෙන්නේ, පළාත් පාලන ඡන්ද විමසීමේදී කාන්තාවන් සඳහා 25% කෝටාව වහාම ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා ලෙස මැතිවරණ කොමිසමේ සභාපතිවරයාගෙන් ඉල්ලා සිටීම,

*ඩේලි මිරර්, 2018 පෙබරවාරි 16*

"දැනටමත් තෝරා පත් කර ගෙන ඇති අය හැරුණු විට වැඩි ආසන සංඛ්‍යාවක් ඇති පක්ෂවලට වැඩි කාන්තා සාමාජිකාවන් ප්‍රමාණයක් ඇතුළත් කරගත නොහැක." එබැවින්, කාන්තා සාමාජිකයන් තිදෙනෙකු සිටිය යුතු නමුත් තෝරා පත් කර ගත් එක් කාන්තා සාමාජිකාවක් පමණක් සිටින පක්ෂයක, නීතිමය බාධකයෙන් මිදීම සඳහා අතිරික්ත කාන්තාවන් දෙදෙනා පත් කිරීමට සභාවේ අනෙක් පක්ෂවලට බල කෙරේ. එය ඔවුන්ගේ 25% පක්ෂ කෝටාව ඉක්මවා යාමට දායක විය හැකිය. "25% රීතියට අපි කොතරම් සහයෝගය දුන්නත්, එය එම පක්ෂවලට සාධාරණ නොවේ," යනුවෙන් කොමිෂන් සභාවේ සභාපතිවරයා පැවසීය. පළාත් පාලන මැතිවරණය පිළිබඳ නව නීතියට අනුව සභාවේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් 25% ක් කාන්තාවන් විය යුතුය. "

*2018 පෙබරවාරි මාසයේ ඉරිදා ඔබ්සර්වර් පුවත්පතේ මහින්ද දේශප්‍රිය මහතා වාර්තා කළේය.*

මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම් ප්‍රමාද වීම පිළිබඳව කනස්සල්ල පළ කරන අතර තෝරා නොගත් අපේක්ෂකයින් පැමිණීමට ඇති හැකියාව පිළිබඳව අවධානය යොමු කරන මෙම මාධ්‍ය ආවරණය 2018 මාර්තු දක්වා අඛණ්ඩව පවතුණි. එම කාලය තුළ පැෆ්රල් ආයතනය විසින් නිකුත් කළ ප්‍රකාශ බොහෝ සභාවන් 25% කෝටාව සපුරා ඇති බැවින් ඒවා ප්‍රමාදයකින් තොරව පිහිටුවිය යුතු බවත් ඉතිරි ඒවා පසුව විසඳිය හැකි බවත් යෝජනා කළේය. මෙම කාලය තුළ පළ වූ බොහෝ ලිපිවලට මැතිවරණ කොමිෂන්

සභාව, මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම් සහ සිවිල් සමාජය මෙන්ම දේශපාලනඥයින්ගේ සම්මුඛ සාකච්ඡා හෝ ප්‍රකාශ ඇතුළත් විය. සමහර ලිපි මගින් සභා පිහිටුවීමේ ප්‍රමාදයන් සහ පහසු විසඳුමක් නොමැති බව සාකච්ඡා කළ අතර, මෙම මැතිවරණයේදී කෝටාව ක්‍රියාත්මක වූයේද නැතහොත් එය තවත් ගැටලු ඇති කළේ දැයි ප්‍රශ්න කළේය. කෝටාවේ ඇති සාධනීය ලක්ෂණ පිළිබඳව මෙන්ම පද්ධතිය පැරණි ක්‍රමයට ආපසු යා යුතුද යන්නත් සාකච්ඡා කෙරුණි. කෙසේ වෙතත් සිවිල් සමාජ කණ්ඩායම්වලින් මේ සම්බන්ධව විශාල විරෝධයක් එල්ල වූ අතර මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා පවා කෝටාව දිගටම පැවතිය යුතු බව ප්‍රකාශ කළේය.

"25% කාන්තා නියෝජනය ගැටළු සහගත බව පනත් කෙටුම්පත සකස් කරන අවස්ථාවේ දී අපි පෙන්වූයෙමු. නමුත් සෑම කෙනෙකුම ඡන්ද විමසීමක් පැවැත්වීමට කැමති වූ බැවින් අපට ඒ ගැන කරදර නොවී මැතිවරණය පවත්වන ලෙස පැවසීය. දැන් අපි කීවාක් මෙන්, ප්‍රායෝගික ගැටළු තිබේ. තරඟකරුවන්ගේ ලැයිස්තුවෙන් 10% කාන්තා නියෝජනයක් තිබීම අනිවාර්ය වේ, නමුත් එක් පක්ෂයක් සියලු ම කොට්ඨාශ ජයග්‍රහණය කළ විට කාන්තා නියෝජනය 25% ට වඩා පහත වැටේ. සාමාජිකයින් හතරකට වඩා අඩු සංඛ්‍යාවක් තෝරා පත් කර ගත් විට කාන්තාවන් පත් කිරීම අනිවාර්යය නොවේ. අනිවාර්යයෙන් 25% ක් සපුරාලීම ගැටලුවක් බවට පත්වන අවස්ථා තිබේ. "

*මහින්ද දේශප්‍රිය 2018 පෙබරවාරි 18 වන දින සිළුමිණ පුවත්පත සමග සම්මුඛ සාකච්ඡාවක දී*

"නීති ක්‍රියාත්මක කරන ලෙස අපි මැතිවරණ කොමසමේ සභාපතිවරයාගෙන්ඉල්ලා සිටියෙමු. කිසිවෙකුට රටේ නීති වෙනස් කළ නොහැකිය. කෝටාව ක්‍රියාත්මක කිරීමේ අදහසින් ජනතාව ඡන්දය දුන් අතර රජය සහ මැතිවරණ කොමිසම එම පොරොන්දුව ඉටු කිරීමට බැඳී සිටී" - අමාත්‍ය ෆයිසර් මුස්තාපා මහතා උපුටා දක්වමින් ඇමතිවරයා සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන් අතර පැවති රැස්වීමක් පදනම් කරගෙන

*දිනමිණ කර්තෘ පිටුව, 2018 පෙබරවාරි 28.*

"මෙය පක්ෂ මුහුණ දී සිටින උභතෝකෝටිකයකි - ඉතා අඩු ඡන්ද ප්‍රමාණයකින් හෝ එක් ඡන්දයකින් පවා වාට්ටු මට්ටමින් පරාජයට පත්විය හැකි ඇතැම් ජ්‍යෙෂ්ට ජනප්‍රිය සාමාජිකයින් සභාවට තේරී පත් වීමට බාධාවක් වී තිබේ. මනාප ලැයිස්තුවේ සියලුම අපේක්ෂකයින් කාන්තාවන් විය යුතු දික්වැල්ල වැනි ස්ථානවල දී ජ්‍යෙෂ්ට ජනප්‍රිය සාමාජිකයින්ට මනාප ලයිස්තුවෙන් සභාවට පැමිණීම සම්පූර්ණයෙන්ම අවහිර කර තිබේ. මෙය විශාල ගැටළුවක් සහ ඔවුන් විශාල කාලයක්, මුදල් හා ශක්තියක් ආයෝජනය කර තිබෙනු ඇත. " යනුවෙන් කොඩිකාර පෙන්වා දුන්නාය. කෙසේ වෙතත්, කෝටාව ක්‍රියාත්මක කිරීම සඳහා සම්මුතීන් ඇති කළ යුතු බව ඇය අවධාරණය කළාය. "එබැවින් සමහර පුද්ගලයින්ට මේ ආකාරයෙන් බලපෑනු ලැබීම වෙනස් කළ නොහැකිය. එය අවාසනාවන්ත තත්ත්වයක්. නමුත් මේ ආකාරයේ කෝටාවක් කරන්නේ එයයි, "කාන්තාවන් ඓතිහාසික වශයෙන් මුහුණ දී සිටින වෙනස් කොට සැළකීම් සහ කොන් කිරීම ආමන්ත්‍රණය කිරීමට කෝටාව උත්සාහ කළ බව ඇය ප්‍රකාශ කළාය. "යම් පිරිමියෙකුට ඇතුල් වීමට නොහැකි වූ බවත් දේශපාලනය පිළිබඳ අත්දැකීම් නොමැති සමහර වැඩකට නැති කාන්තාවක් ලැයිස්තුවට ඇතුල් වූ බවත් මිනිසුන් පවසනු ඇත. එම කාන්තාවට දේශපාලනය පිළිබඳ අත්දැකීම් නොමැත්තේ දේශපාලන පක්ෂ මේ රටේ වැඩ කර ඇති ආකාරය නිසා වෙනි. ජනතාව මෙය තේරුම් ගත යුතුයි.

*පර්යේෂිකාවක් සහ ක්‍රියකාරිනියක් වන චූලනි කොඩිකාර 2018 මාර්තු මාසයේ ඩේලි මිරර් පුවත්පතේ පමග පැවැත් වූ සම්මුඛ සාකච්ඡාවක්*

මැතිවරණය සහ කෝටාව ක්‍රියාත්මක කිරීම බලය සහිත කාන්තාවන් වැඩි ප්‍රමාණයක් සමග ප්‍රජාතන්ත්‍රවාදයේ ජයග්‍රහණයක් බවත්, ඊළඟ මැතිවරණයට පෙර මෙම මැතිවරණයේ පාඩම් සැලකිල්ලට ගත යුතු බවත් මැතිවරණ නිරීක්ෂකයෝ ප්‍රකාශ කළහ. කෙසේ වෙතත්, අමාත්‍ය ෆයිසර් මුස්තාපා මහතාගේ ප්‍රකාශයකින් කියැවුණේ පළාත් සභා මැතිවරණය සඳහා කෝටාව ක්‍රියාත්මක කළ නොහැකි බැවින් එසේ කිරීම සඳහා නව සීමානීර්ණය කිරීම් වාර්තාවක් තිබිය යුතු බවයි.

කොට්ඨාශවලින් තෝරාගනු ලැබීම හා ලයිස්තුවෙන් පත් කර ගැනීම නිසාවෙන් කාන්තා නියෝජනය පිළිබඳ ගැටළුව විසඳීම සඳහා පළාත් පාලන ආයතන මැතිවරණ පනත සංශෝධනය කළ යුතු බවට රජයේ සහ පාර්ලිමේන්තුවේ අවධානය යොමු වී ඇති බව අගමැති රනිල් වික්‍රමසිංහ පවසයි." *2018 පෙබරවාරි 18 වන දින සිළුමිණ පුවත් ලිපිය*

පළාත් පාලන ආයතන නියෝජනය කිරීමේ අවස්ථාව කාන්තා අපේක්ෂකයින්ට අහිමි කිරීමට ඔවුහු (දේශපාලන පක්ෂ) සෑම නිදහසට කරුණක් දෙස බලමින් සිටිති.
*රෝසි සේනානායක සභා පිහිටුවීමේ ප්‍රමාදයන් පිළිබඳව අදහස් දක්වමින්, 2018 මාර්තු ඩේලි මිරර් පුවත්පතේ උපුටනයක්*

සිංහල හා දෙමළ මාධ්‍යයන්හි, විශේෂයෙන් ම ලංකාදීප (ලිපි 7), වීරකේසරි (ලිපි 16) සහ තිනකරන් (ලිපි 6) යන පුවත්පත්වල, සමාරම්භක රැස්වීම්වලින් පසුව ප්‍රාදේශීය සභාවල කෝටාව ක්‍රියාත්මක කිරීම සිදු වන්නේ කෙසේද යන්න පිළිබඳව පසු විපරම් රාශියක් සිදුවිය. මෙම වාර්තා කිරීම්වලට දිවයින පුරා විවිධ පළාත් පාලන ආයතනවලින් ලබාගත් නිශ්චිත වාර්තා අන්තර්ගත කර තිබුණි. මෙම රැස්වීම් පිළිබඳ වාර්තාවලට ගත් තීරණ, කාන්තා මන්ත්‍රීවරුන් තම අදහස් ප්‍රකාශ කළ ආකාරය සහ පොදුවේ සහභාගීත්වය ඇතුළත් විය. පශ්චාත් මැතිවරණ අත්දැකීම් සහ කෝටාවේ සාර්ථකත්වය පිළිබඳව දෙමළ මාධ්‍ය විසින් අලුතින් තේරී පත් වූ කාන්තා මන්ත්‍රීවරුන් සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන් සමඟ සම්මුඛ සාකච්ඡා රාශියක් පවත්වා තිබුණි. මෙම ආවරණයෙන් වැඩි ප්‍රමාණයක් සිදු වූයේ මාර්තු සහ අප්‍රේල් මාසවලදීය.

"පළමු ආදිවාසී කාන්තාව මැතිවරණයට ඉදිරිපත් වී ආදිවාසී ප්‍රජාවගේ ඉතිහාසයේ ස්ථානයක් දිනා ඇත. ඇය ඡන්ද 1369 ක් ලබාගෙන දෙහිඅත්තකණ්ඩිය නගර සභාවේ ආසනය සහතික කර ගත්තා ය. "මගේ ප්‍රජාව මැතිවරණයෙන් ජයග්‍රහණය කිරීම සඳහා මට වැඩි සහයෝගයක් ලබා දී ඇති අතර තම ජනවාර්ගික කණ්ඩායම සහ ආගම වෙනුවෙන් මගේ ජීවිතය කැප කිරීමට මට අවශ්‍යය යයි ඇය පැවසුවාය. ආදිවාසී ජනතාවගේ අධ්‍යාපනය සහ සංවර්ධනය මගේ කාලය තුළ සංවර්ධනය වනු ඇත.  මගේ පළාත් පාලන අත්දැකීම් තුළින් පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් වීමට මට අදහසක් තිබේ."
*2018 පෙබරවාරි මාසයේ වීරකේසරි පුවත්පතේ පළ වූ  පුවත් ලිපියකින්.*

# වාර්තාකරණයේ ප්‍රධාන ගැටළු සහ දුර්වලතා

■ අපේක්ෂිකාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ වාර්තා විශාල ප්‍රමාණයක් පැවතුනද, එම සිදුවීම් පිළිබඳව පසු විපරමක් සිදු නොවීය. වැරදිකරුවන් අත්අඩංගුවට ගෙන තිබේද, නඩු පවරා තිබේද යන්න සහ එහි ප්‍රතිඵල මොනවාද යන්න පිළිබඳව කිසිදු ආවරණයක් නොතිබුණි.

■ පුවත්පත් හෝ මාධ්‍ය ආයතන පොදුවේ මැතිවරණ නිරීක්ෂණ ආයතනවලින් විශාල ලෙස ප්‍රතිලාභ ලැබූ බව පැහැදිලිය. මැතිවරණ ප්‍රචණ්ඩත්වය පිළිබඳ බොහෝ ආවරණ මෙන්ම නීති කඩකර ඇති ආකාරය සහ ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු මෙම කණ්ඩායම් විසින් නැවත අවධාරණය කර ඒ අනුව වාර්තා කරන ලදී. කෙසේ වෙතත්, දෙමළ මාධ්‍ය හා සසඳන විට ඉංග්‍රීසි මාධ්‍ය තුළ වාර්තා කිරීම නිතර නිතර සිදු වී තිබුණි. මෙයින් අදහස් වන්නේ නිරීක්ෂණ ආයතන විසින් භාෂා තුනෙන් ම තොරතුරු බෙදාහැරීම සිදු කළ යුතු බවත්, මැතිවරණ කාලවලදී කරන වාර්තා කිරීම්වලදී දෙමළ මාධ්‍ය ආයතන ස්වාධීන නිරීක්ෂණ ආයතන වැඩි වශයෙන් භාවිතා කළ යුතු බවත්ය.

■ පුවත්පත් වාර්තාකරුවන් විසින්ම කරනු ලබන විශ්ලේෂණයන් ඉතා අල්ප වන අතර සැලකිය යුතු විශ්ලේෂණයන් බොහෝමයක් ලැබෙන්නේ සිවිල් සමාජ සංවිධානවලින් හෝ ක්‍රියාකාරීන් / ප්‍රතිපත්ති සම්පාදකයින් සමග කරනු ලබන සම්මුඛ සාකච්ඡා හරහාය. නිදසුනක් වශයෙන්, ඉංග්‍රීසි පුවත්පත්වල පුළුල් ලෙස පළ කරන ලද කාන්තා ක්‍රියාකාරී ජාලයේ ප්‍රකාශයන් අපේක්ෂිකාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය, විශේෂයෙන් මුස්ලිම් අපේක්ෂිකාවන් සහ ඔන්ලයින් වෛරී ප්‍රකාශන දැකිය යුතු ආකාරය පිළිබඳව සාකච්ඡා කරයි. එවැනි ප්‍රකාශ සහ සම්මුඛ සාකච්ඡාවලින් පිටත එවන් ගැඹුරු විශ්ලේෂණයන්හි දක්නට නොමැත.

■ අපේක්ෂිකාවන් සමග කරන ලද සම්මුඛ සාකච්ඡා හෝ ඔවුන් පිළිබඳ තොරතුරු ඉංග්‍රීසි පුවත්පත්වල පළවූයේ ඉතා අල්ප වශයෙනි. කෝටාව, අපේක්ෂිකාවන් මුහුණ දෙන අභියෝග සහ කෝටාව ක්‍රියාත්මක කිරීම පිළිබඳව නගරාධිපතිනි රෝසි සේනානායක මහත්මිය සමග කිහිප වතාවක් ම සම්මුඛ සාකච්ඡා කළ ද, සිංහල හා දෙමළ පුවත්පත්වල මෙන් වෙනත් අපේක්ෂිකාවන්ගේ හඬ ආවරණය නොවීය. ඉංග්‍රීසි පුවත්පත්වල මැතිවරණයට පසු බලයට පත්වූ කාන්තාවන් සහ ඔවුන්ගේ අත්දැකීම් කෙබඳුද යන්න පිළිබඳව කිසිදු වාර්තාවක් පළ කර නොතිබුණි.

■ 2018 පෙබරවාරි මාසයේ මැතිවරණයට ආසන්නයේ දී අපේක්ෂිකාවන්ට එරෙහිව සමාජ මාධ්‍යවල වෛරී ප්‍රකාශ පැතිරීම බරපතල කාරණයක් වූ අතර මෙම ප්‍රශ්නය පිළිබඳ කාන්තා ක්‍රියාකාරී ජාලයේ ප්‍රකාශයක් හැරුණු විට කිසිදු පුවත්පතක් එහි බරපතලකම සහ නිදහස් හා සාධාරණ මැතිවරණයක් යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න ආවරණය කළේ නැත.

■ අපේක්ෂිකාවන්ගේ සුදුසුකම් සහ යෝග්‍යතාවය පිළිබඳව වාර්තා කිරීමේදී සම්මුඛ සාකච්ඡාවලට භාජනය වූවන්ගෙන් බහුතරයක් කතා කළේ කාන්තා අපේක්ෂකයින් සුදුසුකම්ලත් හා අධ්‍යාපනය ලත් පුද්ගලයින් විය යුතු බවත් දේශපාලනඥයෙකුගේ මව, සහෝදරිය හෝ බිරිඳ නොවිය යුතු බවත්ය. කෙසේ වෙතත්, සම්මුඛ සාකච්ඡා හෝ ලිපි කිසිවක් තුළ පිරිමින් එම ප්‍රමිතියකට යටත් කර ඇත්ද යන්න සහ සභාවේ හෝ පිරිමි අපේක්ෂකයින්ගේ සුදුසුකම් පිළිබඳව ප්‍රශ්න කිරීම ගැන හෝ දැනට දේශපාලන සංස්කෘතිය තුළ ගැඹුරට මුල් බැස තිබෙන ඥාති සංග්‍රහය යන මාතෘකාව පිළිබඳව වෙනස් ආඛ්‍යානයක් හෝ විශ්ලේෂණයක් සිදු නොවීය.

■ මැතිවරණයට පෙරාතුව ඇතැම් මාසවල දී, බොහෝ සතිඅන්ත පුවත්පත්වල කෝටාව හෝ කාන්තා නියෝජනය පිළිබඳව ආවරණයක් නොතිබුණි. දිනපතා පුවත්පත් හා සසඳන විට ජනතාව සතිඅන්ත පුවත්පත් කියවීමට වැඩි නැඹුරුතාවයක් දක්වන බැවින් ගැඹුරු විශ්ලේෂණාත්මක ලිපි මෙන්ම විශේෂාංග ලිපි ද සතිඅන්ත පුවත්පත්වල තිබිය යුතුය. මැතිවරණයට පෙර සතිඅන්ත පුවත්පත්වල පළ වූ ලිපි සංඛ්‍යාව පහත වගුවේ දක්වා තිබේ.

| පුවත්පත | සැප්තැම්බර් 2017 | ඔක්තෝබර් 2017 | නොවැම්බර් 2017 | දෙසැම්බර් 2017 | ජනවාරි 2017 | පෙබරවාරි 2017 | මාර්තු 2017 |
|---|---|---|---|---|---|---|---|
| **සන්ඩේ ඔබ්සර්වර්** | 1 | 0 | 1 | 1 | 4 | 5 | 2 |
| **සන්ඩේ ටයිම්ස්** | 0 | 1 | 1 | 2 | 6 | 4 | 0 |
| **ඉරිදා ලංකාදීප** | 1 | 0 | 0 | 0 | 5 | 5 | 0 |
| **සිළුමිණ** | 2 | 0 | 1 | 2 | 1 | 2 | 1 |
| **ඉරිදා වීරකේසරි** | 2 | 2 | 2 | 2 | 2 | 2 | 2 |
| **ඉරිදා තිනකරන්** | 0 | 2 | 0 | 3 | 3 | 1 | 0 |

වගුව 2: මැතිවරණයට පෙර සතිඅන්ත පුවත්පත්වල පළ වූ ලිපි ගණන

# නිර්දේශ සහ යහපත් භාවිතාවන්

- මැතිවරණ ප්‍රචාරක කටයුතුවල දී සහ මැතිවරණයට පෙර කාලය තුළ දී පුවත්පත් කාන්තාවන්ට වෙන් කර තිබූ අවකාශය බොහෝ දුරට මැතිවරණ ප්‍රචණ්ඩත්වය හෝ නීත්‍යානුකූලව නියම කර ඇති කෝටාව ආවරණය කිරීම සහ ශ්‍රී ලංකා මැතිවරණය සඳහා එයින් අදහස් කරන්නේ කුමක්ද යන්න වාර්තා කිරීම සඳහා වෙන් කර තිබුණි. ප්‍රජාතන්ත්‍රවාදය සහ යහපාලනය ප්‍රවර්ධනය කිරීම සඳහා මාධ්‍යයට වගකීමක් ඇති අතර මේ සඳහා ඔවුන් ක්‍රියාකාරී වනවාට වඩා අනාගත ගැටළු, අවශ්‍යතා හා වෙනස්කම් හඳුනාගෙන ක්‍රියාත්මක වීම අවශ්‍ය වේ. කාන්තා අපේක්ෂකයින් තේරී පත්වුවහොත් ඔවුන්ගේ සැලසුම් සහ ඔවුන්ගේ අත්දැකීම් පිළිබඳව සිංහල හා දෙමළ පුවත්පත්වල යම් වාර්තාකරණයක් පැවතුනද, මේ ආකාරයේ වාර්තා කිරීමක් ඉංග්‍රීසි මාධ්‍යවල දුටුවේ ඉතාමත් අඩුවෙනි. කෙසේ වෙතත්, මෙම සියලු ආවරණයන්හි විස්තර රාශියක් ආවරණය කර නොතිබුණි - නිදසුනක් ලෙස ප්‍රතිපත්ති, ඔවුන් අවධානය යොමු කිරීමට අදහස් කරන ගැටළු හෝ ඔවුන්ගේ දේශපාලන දිශාවන් පිළිබඳ වැඩි විස්තර වැනි දේ. නගරාධිපති රෝසි සේනානායක මහත්මිය සමඟ කළ සම්මුඛ සාකච්ඡාවල දී මෙය යම් දුරකට ආවරණය කළ නමුත් එය රට පුරා සිටි අනෙකුත් අපේක්ෂිකාවන් සමඟ අනුගමනය කරන සම්මත භාවිතාවක් දක්නට නොලැබුණි.

- මැතිවරණ ප්‍රචණ්ඩත්වය පිළිබඳව පුළුල් ලෙස වාර්තා කිරීම ඉතා වැදගත් වන අතර, සියලු සිදුවීම් පිළිබඳව සොයා බැලීම මාධ්‍ය ආයතනවලට අපහසු විය හැකිය. මෙවැනි අවස්ථාවල දී, මැතිවරණ නිරීක්ෂණ ආයතන සහ ක්‍රියාකාරී කණ්ඩායම් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. මැතිවරණ ප්‍රචණ්ඩත්වය පිළිබඳ කාලෝචිත යාවත්කාලීන කිරීම්, ප්‍රධාන සිදුවීම්වලින් පසු කරන ලද ක්ෂණික පුවත්පත් නිවේදන අත්‍යවශ්‍ය වන අතර ප්‍රමාණවත් ආවරණයක් ලබා ගැනීම සඳහා තොරතුරු භාෂා තුනෙන්ම බෙදා හැරිය යුතුය. මෙම කණ්ඩායම් විසින් සපයනු ලබන තොරතුරු පිළිබඳව පුවත්පත් ආයතන ද යාවත්කාලීන වී සිටිය යුතුය. මෙවැනි සිදුවීම් වාර්තා කිරීමේදී, සිද්ධිය පමණක් ආවරණය කිරීම ප්‍රමාණවත් නොවේ. ඔවුන්ගේ ප්‍රතික්‍රියාව සහ ඔවුන් ගත යුතු ක්‍රියාමාර්ගය පිළිබඳව ද මැතිවරණ කොමිසමෙන් ප්‍රකාශ ලබා ගත යුතුය. තවද, ප්‍රධාන සිදුවීම් පිළිබඳ පසු විපරම් කිරීම සහ කිසියම් අත්අඩංගුවට ගැනීමක් සිදුවී ඇත්ද, නඩු පවරා තිබේද යන්න සහ පොදුවේ සිදුවීමේ ප්‍රතිඵල පිළිබඳව ද ආවරණය කළ යුතුය. මෙය වෙනත් ආකාරයකින් කාන්තාවන්ට අනාගතයේ දී මැතිවරණයට ඉදිරිපත් වීම වළක්වා ගත හැකි භූ දර්ශනයක් නිර්මාණය කරනු ඇත. කාන්ති අපේක්ෂිකාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ගැන පමණක් දැන ගන්නා අතර එම සිදුවීම් සම්බන්ධයෙන් කටයුතු කළ ආකාරය පිළිබඳ කිසිදු තොරතුරක් දැන නොගනී. පසු විපරමක් හෝ ප්‍රතිඵලයක් නොතිබීම මෙන්ම වරදට දඬුවම් නොලබා සිටීමේ සංස්කෘතිය පිළිබඳව වාර්තාගත කර තිබීම අවධානය යොමු කළ යුතු වැදගත් වාර්තාකරණයකි.

- මැතිවරණයක් සඳහා තරඟ කිරීමේදී කාන්තාවන් හිංසනයට හෝ ප්‍රචණ්ඩත්වයට මුහුණ දෙන විවිධ ක්‍රම වාර්තා කරන විට, මාධ්‍යවේදීන් ද සිදුවීම් වාර්තා කිරීමෙන් ඔබ්බට ගොස් ගැටලුවේ බරපතලකම මහජනයාට දැනුම් දිය හැකි මාර්ග සොයා ගත යුතුය. නිදසුනක් වශයෙන්, අපේක්ෂිකාවන් සමඟ සම්මුඛ සාකච්ඡා හෝ විශේෂාංග ලිපි හෝ මැතිවරණ ප්‍රචාරක කාල පරිච්ඡේදයක් තුළ කාන්තාවක් ලෙස එයට මුහුණ දීම වැනි දේ හරහා ගැඹුරු හා සූක්ෂම ආඛ්‍යානයක් ඉදිරිපත් කරනු ලබයි.
- තොරතුරු ජනතාව වෙත ගලා එන ආකාරය සම්බන්ධයෙන් මැතිවරණ නිරීක්ෂණ ආයතන සහ සිවිල් සමාජ සංවිධාන තීරණාත්මක

කාර්යභාරයක් ඉටු කරන බව පැහැදිලිය. සැලකිය යුතු ආවරණයක් සහ ගැඹුරු විශ්ලේෂණයක් මෙම කණ්ඩායම්වල ප්‍රකාශ හා ඔවුන් සමග කරන ලද සම්මුඛ සාකච්ඡාවලින් ලැබී තිබේ. එහෙයින් බෙදා හරින ඕනෑම තොරතුරක් භාෂා තුනෙන් ම ලබා දීම වැදගත්ය. පුවත්පත් විසින් ම සැලකිය යුතු විශ්ලේෂණයක් හෝ ආවරණයක් ලබා නොදේ. පුරවැසියන්ට කාලෝචිත ආකාරයකින් නිවැරදි තොරතුරු ලබා ගැනීම සහතික කිරීම සඳහා මෙම කණ්ඩායම්වල කාර්යයන් ශක්තිමත් කිරීමට සහාය දැක්විය යුතුය.

■ කෙසේ වෙතත්, සියලුම මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම් මෙහෙයවනු ලබන්නේ පිරිමින් විසින් බව අවධාරණය කළ යුතු අතර එබැවින් ඔවුන්ගේ නිමැවුම් මත පූර්ණ ලෙස යැපීමක් නිර්දේශ නොකරයි. ජනමාධ්‍ය ආයතන කාන්තා ක්‍රියාධරයින්ගේ / කාන්තා අයිතිවාසිකම් සංවිධානවල මාධ්‍ය ප්‍රකාශ ආවරණය කළ ද සම්මුඛ සාකච්ඡා, විශේෂාංග හෝ දායකත්වයන් සඳහා ඔවුන් ඒවා ක්‍රියාකාරී ලෙස සොයා නොයන බව මෙම පර්යේෂණයෙන් පැහැදිලි වේ. කාන්තා සංවිධාන විසින් කරනු ලබන දායකත්වයේ වටිනාකම වාචිකව ප්‍රතිනිෂ්පාදනය කරන ප්‍රකාශ සහ සංක්ෂිප්ත මගින් පෙන්නුම් කෙරේ. එබැවින් මාධ්‍ය ආයතන සහ මාධ්‍යවේදීන් ඔවුන්ට වඩා සැලකිය යුතු ආවරණයක් ලබා දිය යුතුය.

■ සාම්ප්‍රදායික මාධ්‍යයක් වන පුවත්පත් තවමත් සාම්ප්‍රදායික ආකාරයකින් මැතිවරණ ආවරණය කරයි. අන්තර්ජාලය, සමාජ මාධ්‍ය සහ ජංගම දුරකථන වැනි දේ මැතිවරණ ක්‍රමයක් තුළ නව ආකාරයේ තර්ජන හා ප්‍රචණ්ඩ ක්‍රියා වාර්තා කිරීමට ඒවා ප්‍රමාණවත් ලෙස පරිණාමය වී නොමැත. මෙම ගැටළු වටා ඉලක්කගත පුහුණු කිරීම් සහ ඒවා මුද්‍රිත මාධ්‍යයෙන් වාර්තා කරන්නේ කෙසේද, මැතිවරණ කාලවලදී ඔවුන් අන්තර්ජාලය හරහා දකින දේ විශ්ලේෂණය කරන්නේ කෙසේද යන්න වැදගත් අවශ්‍යතාවයකි.

■ සමාජ මාධ්‍ය භාවිතා කරමින් කරන, විශේෂයෙන් මැතිවරණයකදී සහ මැතිවරණ ව්‍යාපාරයක දී ෆේස්බුක් භාවිතා කිරීම ඇතුළත් සමස්ත වාර්තාකරණයක් නොපැවතුණි. මැතිවරණවල දී සමාජ මාධ්‍යවල කාර්යභාරය, එය මැතිවරණවල දී භාවිතා කළ හැකි ආකාරය, පුළුල් ප්‍රවණතා සහ භාවිතයන් දෙස බැලීමට විශාල දත්ත භාවිතා කිරීම පිළිබඳ වඩාත් ශක්තිමත් වාර්තාකරණයක් සහ විශ්ලේෂණයක් තිබිය යුතුය. මෙය මුද්‍රිත මාධ්‍ය තවමත් වැළඳ නොගත් දෙයකි.

■ පළාත් පාලනයේ යෙදී සිටින කාන්තාවන්ට ඔවුන්ගේ භූමිකාවන්, ඔවුන් මුහුණ දෙන අභියෝග, අභියෝගයන්ට මුහුණ දීම සඳහා ඔවුන් භාවිතා කරන උපායමාර්ග සහ අධිකාරී තනතුරුවලට ඔවුන් ඇතුළත් කර ගැනීම ප්‍රතිපත්ති සම්පාදනයට සහ පාලනයට බලපාන්නේ කෙසේද යන්න පිළිබඳව වැඩි ආවරණයක් තිබිය යුතුය. මෙම ආවරණය සඳහා වසර ගණනාවක් තිස්සේ දේශපාලනයේ / පාලන කාර්යභාරය ඉටු කළ කාන්තාවන් මෙන්ම අලුතින් තේරී පත් වූ කාන්තාවන් ද ඇතුළත් කළ හැකිය.

■ මිත්‍ර පාක්ෂිකයින් ලෙස සැලකිය හැකි තේරී පත් වූ ආයතනවල පිරිමින්ගේ අදහස් සහ මත, පාලනයේ හා ප්‍රතිපත්ති සම්පාදනයේ වැඩි කාන්තාවන් සංඛ්‍යාවක් ඇතුළත් වීම පළාත් පාලන ආයතනවල පාලනයට බලපා ඇත්තේ කෙසේද, අලුතින් තේරී පත් වූ කාන්තාවන්ට සහයෝගය දැක්විය හැකි ආකාරය, විවිධ සභාවල මෙතෙක් ලබා ඇති අත්දැකීම් ආදිය පාලනයේ කාන්තා නියෝජනයේ ඇති වැදගත්කම පිළිබඳ ආවරණයට වටිනා එකතු කිරීමක් කරනු ඇත.

■ පාලනයේ යෙදෙන කාන්තාවන් හෝ මැතිවරණ සඳහා තරග කරන කාන්තාවන් මාධ්‍ය තුළ නිරූපණය වන ආකාරයට වඩා හොඳ සමබරතාවයක් සහතික කිරීමට මාධ්‍යවේදීන් උත්සාහ කළ යුතුය. මෙයින් ලිංගික ඒකාකෘතිවල කාන්තාවන් නිරූපණය කිරීම පමණක් නොව, අපේක්ෂිකාවන් හෝ කාන්තා නියෝජනය ඉදිරිපත් කරන ආකාරය පිළිබඳව සම්මුඛ සාකච්ඡා කළ පුද්ගලයින්ගේ අදහස් හෝ ප්‍රවෘත්ති වාර්තා කිරීම හරහා ප්‍රති-ආඛ්‍යාන ඉදිරිපත් කිරීම අදහස් කෙරේ. නිදසුනක් වශයෙන්, අපේක්ෂිකාවන්ගේ යෝග්‍යතාවය සහ ඥාති සංග්‍රහය යන මාතෘකාව යටතේ, පුරුෂයින් මෙම ප්‍රමිතීන්ට අනුකූල, යටත් නොවන ආකාරයත්, පවත්නා දේශපාලන සංස්කෘතියෙන් ඉවත් වීමට අවශ්‍ය වන්නේ කුමක්ද යන්නත් ඉස්මතු කිරීම ඉතා වැදගත්ය.

WMC කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය

Norwegian Embassy
*Colombo*